# සැදෑව

சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2014 ඔක්තෝම්බර්/ දෙසැම්බර් කලාපය.




වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක : QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.





# Dr Gamani Corea (1925 -2013)



Dr Gamani Corea who passed away a year ago was undoubtedly the most illustrious Sri Lankan economist.

Dr. Gamani Corea made an enormous contribution to development thinking in Sri Lanka and internationally. This article captures the genesis and transitions in his thinking from his early days, during his mission at UNCTAD and his later involvement with the South Commission. It summarises very briefly his career and contributions nationally and internationally: his contributions towards the New International Economic Order, the North-South Dialogue and the South Commission by reforming the existing commodity trading system to bring about a more just and equitable international economic order.

## *His Career*

Dr Corea began his career at the Central Bank of Sri Lanka where he became influential as Director of Economic Research and retired as its Deputy Governor (1970-1973). His career at the national level included being Director General of the Planning Secretariat where he was the architect of the TEN YEAR PLAN that chartered the course of economic transformation for the Sri Lankan economy. He played a key role in formulating economic policy in Sri Lanka during his tenure as Permanent Secretary to the Ministry of Planning and Economic Affairs during 1965-1970.

He was the founder Chairman of the Marga Institute for Development Studies and the Institute of Policy Studies. He was Chancellor of the Open University of Sri Lanka. He played a key role in many associations and institutions in Sri Lanka.

In 1973, Dr. Corea was appointed Sri Lanka's ambassador to the European Economic Community (EEC) and the Benelux countries (Belgium, Luxembourg and the Netherlands).

In 1963 he was invited by Raul Prebisch to be a member of the team for the preparation of the first UNCTAD Conference in 1964. He served as Secretary General of UNCTAD from 1974 to 1984. During his tenure, UNCTAD experienced one of the most active moments of its history that has been called the "Corea Decade." He was also instrumental in the establishment of the Group of 77. He served as a member of the South Commission (1987-1990) and was a member and chair of the Board of the South Centre (2002 to 2003).



Dr. Corea promoted international economic policies aimed at benefiting developing countries and reinforced unity among nations of the South and enhanced their position in multilateral negotiations. He introduced the Integrated Programme for Commodities, commonly known as the Corea Plan. He was the prime mover for the establishment of the Common Fund for Commodities.

Dr. Corea's influence on the decision to establish the Highly Indebted Poor Countries (HIPC) initiative was another of his accomplishment having previously chaired the Expert Group of the Non-Aligned Movement on Third World Debt, which served as the basis for the HIPC initiative. He was a strong proponent of a New International Economic Order (NIEO).

Dr Corea's contributions to Sri Lanka and the international community have been captured succinctly by the former Prime Minister of India Dr Manmohan Singh:


"Gamani's work and thinking in the arena of economic development were of immense significance, not only for Sri Lanka, but also for developing countries around the world. His contribution to the world of UNCTAD during his time as its Secretary General was particularly important in ensuring that the voice of developing countries was heard and that their developmental priorities were not lost sight of. He lent his influential voice in support of some of the most important international initiatives aimed at the welfare of developing countries, such as the Integrated Program for Commodities, and the Highly Indebted Poor Country Initiative."

**Dr. Nimal Sanderatne (544)**

## In What way is association with the unpleasant suffering?

**People**

It is painful to work with inconsiderate or uncooperative colleagues to be subordinate to an excessively demanding or unreasonable superior to have an apathetic or dishonest business partner, to live next to inconsiderate neighbors to be married to an unsuitable spouse, to witness strained relations between one's spouse and one's parents and family members.



**D. E. Abeyweera**
**(507)**
**0112-913901**

திருமதி மனோகரி ராமநாதன் (நாணயச்சபை உறுப்பினர்) அவர்கள் இலங்கை மத்திய வங்கி நவராத்திரி விழாவில் 03-10-2014 இல் ஆற்றிய உரை.





# நவராத்திரி

எமது வாழ்வில் ஏற்படக்கூடிய துன்பங்ளையும், தடைகளையும் நீக்கி அனைத்து ஜீவராசிகளுக்கும் ஆதரவான உன்னத தாயான பராசக்தியின் ஆசிகளை வேண்டி நாம் நவராத்திரி விழாவைக் கொண்டாடுகின்றோம்.

நவராத்திரியானது ஒவ்வொரு வருடமும் வெவ்வேறு காலங்களில் கொண்டாடப்படுகின்றது. அவையாவன வசந்த நவராத்திரி, அஷ்ட நவராத்திரி, சாரதா நவராத்திரி மற்றும் குப்த நவராத்திரி ஆகும். அவற்றுள் புரட்டாதி மாதத்தில் கொண்டாடப்படும் சாரதா நவராத்திரி அல்லது மகா நவராத்திரியானது மிவும் முக்கியமாதனகும்.

மகா நவராத்திரியானது வழமையாக புரட்டாதி மாதம் வரும் அமாவாசையை அடுத்த முதல் நாள் ஆரம்பமாகி ஒன்பது நாட்களுக்கு நீடிக்கும் விழாவாகும். நவராத்திரி என்னும் சொல்லானது சமஸ்கிருத மொழியிலே ஒன்பது இரவுகள் என பொருள்படுவதுடன், இவ்வொன்பது இரவுகளிலும் பத்து நாட்களிலும் பின்வரும் வடிவங்களிலே தேவியானவள் வணங்கப்படுகின்றாள்:

- துர்க்கை
- பத்திரகாளி
- ஜெகதாம்பாள்
- அன்னபூரணி
- சர்வமங்களா
- பைரவி
- சண்டிகா
- லலிதா
- பவானி



பத்தாவது நாள் விஜயதசமி என வழங்கப்படுகிறது. இந்த நாளிலும் மஹிசாசுர மர்த்தினி என்னும் வடிவில் தேவியானவள் போற்றப்படுகின்றாள்.

புராணங்களின் அடிப்படையில், அசுரர்களின் அரசனான "ரம்பா" ஒரு காலத்தில் நீர் எருமை ஒன்றின்மீது காதல் கொண்டான்.

இந்தச் **உறவின்** மூலம் மனித உடலும் எருமையின் தலையும் கொண்டவனாக மஹிசாசுரன் பிறந்தான். அவன் அதீத பலசாலியாகவும், கொடூரமும் தீய குணங்கள் கொண்டவனாகவும் இருந்தான்.

பலம்பொருந்திய மஹிசாசுரனால் தேவர்கள் தோற்கடிக்கப்பட்டு, **துன்புறுத்தப் பட்டார்கள்** ஆகவே இந்த அசுரனை அழிக்க வேண்டி மும்மூர்த்திகளான பிரம்மா, விஷ்ணு, ஈஸ்வரன் ஆகியோர் பராசக்தியை வேண்டினர். தேவர்களைக் காப்பாற்றும் பொருட்டு தூய தாயானவள் துர்க்கை வடிவெடுத்து மஹிசாசுரனைப் போருக்கு வருமாறு அறைகூவினாள். ஒன்பது நாட்களாக நடைபெற்ற கடுமையான யுத்தத்தின் பின்னர் பலசாலியான மஹிசாசுரனைப் பத்தாவது நாள் துர்க்காதேவி வதம் செய்தாள் – இந்நன்னாளே, தீய செயல்கள் அழிக்கப்பட்ட பின்னர் கிடைக்கப்பெற்ற நற்பேறுகளை அடையாளப்படுத்தும் விஜயதசமியெனக் கொண்டாப்படுகிறது.

எனவே, துர்க்காதேவியானவள் மஹிசாசுரனை அழித்ததனால் மஹிசாசுர மர்த்தினி என்று அழைக்கப்படுகின்றாள்.

வாழ்வில் எமக்குச் சகல துறைகளிலும் வெற்றிகள் கிடைப்பதற்கு நல்லாரோக்கியம், **செல்வம்** அறிவு ஆகிய மூன்று அம்சங்களும் தேவை. இதனைக் குறிக்குமுகமாக நவராத்திரியானது மும்மூன்று நாட்களாகப் பிரிக்கப்பட்டு துர்க்கை, இலட்சுமி, சரஸ்வதி என அதியுன்னத தாயான **சக்தி** வணங்கப்படுகின்றாள்.

எமது சகல **தீய** செயல்களும், அசுத்தங்களும், குறைகளும் அழிக்கப்பட்டு எமக்கு நல்ல வரங்கள் கிடைக்கும்பொருட்டு முதல் மூன்று நாட்களும் தாயானவள் துர்க்கை **யாக வணங்கிப் போற்றப்படுகின்றாள்**

அடுத்த மூன்று நாட்களும் தாயானவள் தனது பக்தர்களுக்குக் குறைவற்ற செல்வங்களையும், வளங்களையும் அளிக்கக்கூடிய சக்தியுடையவளாகக் கருதப்படும் இலட்சுமியாக வணங்கிப் போற்றப்படுகின்றாள்.

இறுதி மூன்று நாட்களும் கல்வியின் வடிவமான சரஸ்வதியாகக் கருதப்பட்டு ஞானத்தின் தெய்வமான தாயாக வணங்கப்படுகின்றாள்.

சரஸ்வதி பூசையானது நவராத்திரியின் ஒரு பகுதியாக ஒன்பதாம் நாள் நடைபெறுவதுடன், அதனையடுத்து தேவியின் அருள் வேண்டி நூல்கள்,

கருவிகள், ஆயுதங்கள் போன்றவற்றை வைத்து வணங்கும் ஆயுத பூசையாகவும் வணங்கப்படுகின்றது.

நவராத்திரியின் மற்றுமொரு அம்சம் கொலு வைத்தலாகும். கொலுவின் வெவ்வேறு படிகளிலே மரங்கள், கற்பாறைகள், ஊர்வன, மிருகங்கள், பறவைகள், மனிதர்கள், முனிவர்கள், ஆண் பெண் தெய்வங்கள் ஆகியவற்றின் சிற்பங்கள் ஒழுங்கு வரிசையில் வைக்கப்படும். படிகளின் எண்ணிக்கை வழக்கமாக மூன்று, ஐந்து, ஏழு அல்லது ஒன்பதாகவிருக்கும். உயர்ந்த படிகளில் தெய்வங்கள் வைக்கப்பட்டு மற்றையவை இறங்கு வரிசையில் ரிஷிகள், தேவர்கள், அசுரர்கள், மனிதர்கள், விலங்குகள், மரங்கள், பாறைகள் என்றவாறு அவர்கள் தம் தன்மைகளுக்கேற்ப வைக்கப்படும். இது நாம் கா்ம சுழற்சியில் ஈடுபட்டு விடுதலை பெறுமுன் எடுக்க வேண்டிய பிறவிகளை ஞாபகப்படுத்துவதேயாகும்.

நவராத்திரி விழாவானது பூசை வழிபாடுகளை மட்டும் உள்ளடக்கியதாக அல்லாமல், கலாச்சார நிகழ்ச்சிகளையும், பிரசாதம் என்னும் வகையில் பக்தர்களுக்குப் பல்வேறு வகையான இனிப்புப் பண்டங்களை வழங்கிக் கொண்டாடப்படும் ஒரு பண்டிகையாகவும் உள்ளது.

என்னுடைய உரையினைப் பராசக்தியின் அருள் வேண்டிப் பிரார்த்தனையுடன் முடிக்க விரும்புகின்றேன்.

அனைவருக்கும் வணக்கம் – துர்க்காதேவியின் பாதங்கள் தாமரை மலர்கள் போன்று அழகானவையும், எல்லோராலும் பாராட்டப்படுபவையுமாகும்.

அனைத்து நலன்களையும் அதிர்ஷ்டங்களையும் அவளே வழங்குபவள்

ஓம் தூய அன்னையே! எங்களுக்கு ஆன்மீக அழகு, வெற்றி, பெருமை, செழிப்பு ஆகியவற்றை அருளுங்கள். தயவுசெய்து எங்கள் உள்ளக எதிரிகளை அழியுங்கள்.

சக்தியானவள் நம் அனைவருக்கும் அவளது நல்லாசிகளை வழங்கி நம் உள்ளங்களில் மகிழ்வும், சமாதானத்தையும், அளவற்ற சௌபாக்கியங்களையும் நல்குவளாக.







# - බුද්ධිමතෙකුගේ දැක්මක් හා විසඳුමක් -

'' **ප්‍රත්‍යශතකය** '' කියන්නේ සංස්කෘත භාෂාවෙන් ලියැවුණු අගනා, ප්‍රකට කෘතියක්. ඒ පොතේ අඩංගු කරුණු දාර්ශනික තලයට අයත් දේවල් වලින් අනූනයි. දර්ශනය කියන්නේ ආගමට වඩා ඉදිරියට ගිය දෙයක්. ආගම විශ්වාසය මත පදනම් වූවක් නිසා එය ප්‍රාථමිකයි. දර්ශනය සැබෑව මත දිගේලි වන නිසා එය ද්විතිකයි. විශ්වාසය දියාරුයි. ඒත් සැබෑව ශක්තිමත්. විශ්වාසයට සමීප වීමට නම් අවශ්‍ය වන්නේ හුදු හැඟීමක් විතරමයි. ඒත් සැබෑව හෙවත් සත්‍යය ග්‍රහණය කර ගැනීමට නම් බුද්ධිය අවශ්‍යමයි. බුද්ධිය ඇත්තා බුද්ධිමතායි. බුද්ධිමතා හඳුනා ගැනීමට ඉවහල්වන මූලික කරුණු 10 ක් ඉහතින් සඳහන් කළ ප්‍රත්‍යශතකයේ මෙහෙම සඳහන් වෙනවා.



''අක්‍රෝධමාරෝග්‍ය පිතේන්ද්‍රියත්වං
දයා ක්‍ෂමා සර්ව ජනප්‍රියත්වම්
නිර්ලෝභිදානා භය ශෝක මුක්තිර්
ඥාණ ප්‍රභේද දශ ලක්ෂණානි''

(ක්‍රෝධ නැති බව, රෝග නැති බව, දමනය කරන ලද ඉඳුරන් ඇති බව, දයාව, ඉවසීම, සියලු දෙනා ප්‍රිය වීම, ලෝභ නැති බව, ත්‍යාගශීලි බව, භය නැති බව, ශෝක නැති බව ආදිය බුද්ධිමතාගේ ලක්ෂණ දහයයි).

බුද්ධිමතුන්ගේ මූලික ලක්ෂණ ගැන කතා කරන්නේ ඔවුන් හඳුනා ගැනීමට සුදුසුම කාල වකවානුවක් එළඹ ඇති නිසයි. සංස්කෘතික, සමාජීය, ආර්ථික හා දේශපාලනික හැඩගැස්ම හා භාවිතය කඩඹග්ගියක තියලා අලෙවි කරන වකවානුවක, මෙතෙක් නොතකා නොසලකා හැර හෝ කුඩම්මාගේ සැලකිලි ලැබූ **විශ්‍රාමික ජන කොටස** ගැන රටේ ඉහළම අවධානය යොමු වීම බුද්ධිමත් ක්‍රියාවක් බව අමුතුවෙන් කිව යුතු නැත.

රටේ වැඩිහිටි ජනගහන ස්ථරය පුළුල් වෙලා. වැඩිහිටි ජනගහන ස්ථරය තුළ තමයි රජයේ විශ්‍රාමිකයෝ ඉන්නේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයෝ ඉන්නෙත් ඒ පිරිස ඇතුලෙමයි. සංඛ්‍යාත්මකව විශ්‍රාමිකයින් ප්‍රමාණය අති විශාලයි. මේ පිරිස අතරේ වැටුප් විෂමතාව ඇදිලා එන්නේ සෑහෙන කාලෙක ඉඳලා. රටේ ඉහළ තනතුරුවලට ආපු, ඒ වගේම ඇවිල්ලා ගියපු හැමෝටම මේ චින්නැහිය ගැන - මේ අලකලංචිය ගැන කිව්වා, ලිව්වා, පෙන්නලා දුන්නා, ලැබුණ ප්‍රතිචාර වුණේ තර්ක විතර්ක, නැත්නම් බැට් බැරියාව, ඒත් නැත්නම් නොහැකියාවයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විශ්‍රාමිකයින් හැටියට වර්තමානයට එකතු වෙන්නේ **ඔවුන්ගේ ශ්‍රම ශක්තිය හා ඔවුන්ගේ හෙට දිනය වර්තමානිකයාගේ අද දිනයට කැප කළ නිසා** බවවත් හිතන්නේ නැතුවයි නොසලකා හැරියේ. සහානුවේදනීය බුද්ධියකට තමයි මේ සැබෑව දැනෙන්නේ.



රටක ඉදිරි ගමන කියන්නේ රටේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළට එසවීමේ ක්‍රියාවටයි. ''රටේ ජනතාව'' කියන සංඥානාමය තුළ විශ්‍රාමිකයන් හෙවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඉන්නවා. ඒ අයගේ ක්‍රයශක්තිය ඉහළ දැමීම හා ජීවිත සතුට (Entertainment) ළඟා කර දීමත් යුතු කමක්. එතකොට තමයි ''ලෝක සතුටු රාජ්‍ය '' ලැයිස්තුවේ ස්ථානීය අගය තනි ඉලක්කමක තිට්ටුවට එන්නෙ. ඒ වගේම ''අසමත් රාජ්‍යයන්ගේ'' ලැයිස්තුවේ තනි ඉලක්කම් අභිබවා ඉලක්කම් දෙකේ තුනේ සීමාවට ළඟා වෙන්නේ. වැඩිහිටි ජනගහන ස්ථරය පුළුල් බවත්, සෞඛ්‍ය සේවාවන්ගේ පුළුල් වීමත්, ඒ නිසා ආයු අපේක්ෂාව වැඩි වීමත් කියන සාධක ගැන තේරුම් ගන්න නම් බුද්ධිමතෙක්, සහානුවේදනීය වෙන්න ඕන. මුලින්ම සඳහන් කරපු ආකාරයේ කරුණු 10 ත් අනූන බුද්ධිමතාට මේ අවනඩුව තේරුනා. නොතකා නොසලකා හැර තිබූ වැටුප් විෂමතාවයට විසඳුම සියලුම රාජ්‍ය විශ්‍රාමිකයන් හට ලබා දිය යුතු බව උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉඳගෙනම කිව්වා. කිව්වා විතරක් නෙමෙයි 2015 දක්වාම යාවත්කාලීන කළ යුතු බවටත් ප්‍රකාශ කළා.

මෙම ප්‍රකාශයත්, මෙම යාවත්කාලීන කිරීමේ ප්‍රතිලාභත් ලංකාවේ දැනට වාර්තාවන වයස්ගතම විශ්‍රාමික රජයේ සේවකයාට ලැබුනොත් මොනතරම් සතුටක් සැනසිල්ලක් ලැබේවිද?. ඔහු වයස අවුරුදු 104 ක් වන, තවමත් රුපියල් හාරදහස් එකසිය ගණනක් විශ්‍රාම වැටුප හැටියට ගන්නා, මේ වන විටත් පනස් වසරක්ම විශ්‍රාම වැටුප් ලබා ගෙන ඇති, **වව්නියාවේ වේලායුදන් මහතායි**. ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන් අතරත් අවුරුදු 103 ක් ඉක්මවූ විශ්‍රාමිකයකු පිළිබඳව මීට කලින් ''සැදෑව 2013 ජූලි / සැප් කලාපයෙන්'' හෙළි කොට ඇති.

2020 දී අපේක්ෂිත ඒක පුද්ගල ආදායම ඇ ඩොලර් 7000/- සීමාව පසු කරන බවට මහ බැංකු අධිපතිතුමා 2014/11/04 වන දින MTV රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවේදී **මයිකල් ෆ්‍රෙග්සන්** නම් මාධ්‍යවේදියාට දුන් පිළිතුර ද බුද්ධිමත් බව සත්‍යයක්. ඒ එක්කම විශ්වාසයට වඩා සැබෑව ශක්තිමත් බව ද සටහන් කරන්නම ඕනෙ. ඒ වගේම අයවැය යෝජනා ක්‍රියාත්මක වන තුරු මහ බැංකු විශ්‍රාමිකයන් සැබෑවටම ඔබතුමා ගැන පූර්ණ විශ්වාසයකින් ඉන්නෙ.

- **සංස්කාරක** -

# පියවරෙන් පියවර ඉදිරියට.....



ගියවර අපේ ආදර්ශ පාඨය වුයේ '' අපි තව තවත් එකමුතු වෙමු. අපේ අරමුණ ජය ගනිමු''යන්නයි. මෙවර අපි තවත් පියවරක් ඉදිරියට තැබීමු. '' පියවරෙන් පියවර ඉදිරියට'' මෙවර අපේ ආදර්ශ පාඨයයි.

මහ බැංකු විශ්‍රාමිකයන්ගේ පොදු වේදිකාව, එකම හඬ තව තවත් තහවුරු කරන්නට, වඩ වඩාත් ශක්තිමත් කරන්නට අපි පියවරෙන් පියවර ඉදිරියට යන්නෙමු. ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ ප්‍රාදේශීය නියෝජිත සභාවේ 2014 දෙවන ත්‍රෛමාසික හමුව පසු ගිය ඔක්තෝම්බර් 15 වන දින මහ බැංකු ගොඩනැගිල්ලේ 16 වන මහලේ වෘත්තීය සංගම් කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්විණ. මේ ඒ පිළිබඳ කෙටි සටහනක්.

ගිය වරට වඩා වැඩි පිරිස් සහභාගීත්වයක් මෙවර දක්නට ලැබීම අප පියවරෙන් පියවර තබන්නේ ඉදිරියටම බැව් පසක් කරවන සුභ ලකුණක් විය. ප්‍රාදේශීය නියෝජිත පිරිස හා සමගම විධායක කමිටු නිළධාරීන් පිරිසක් ද එක් රැස්ව සිටීම අදහස් උදහස් හුවමාරුවට මෙන්ම තම සංකල්ප සමාලෝචනයට ද අවස්ථාව පෑදීය.

අප බාල අවධියේ උගත් සමගියේ බලය විදහා දක්වන කෝටු මිටියේ කථාව හා වටුවන්ගේ එක්සත් කමේ කථාව ඇත්ත ද බලන්නට අද අපට අවස්ථාව උදාව ඇත්තේය. භේද භින්නව තනි තනිව හුදෙකලා වුවහොත් අප පරාජය හිස මතට කඩා පාත් කර ගන්නමෝ වෙමු. එකමුතුව එක්සත්ව සිටියහොත් නිසැකවම අපි ජය මාවතට පිවිසෙන්නෝ වෙමු. දැන් අපි ඒ මගට පිවිස සිටිමු.

එම රැස්වීමෙහි මුලසුන දැරුවේ විශ්‍රාමික සංගමයේ ගරු සභාපති ලක්ෂ්මන් ද සිල්වා මහතාය.

පසු ගිය අගෝස්තු 29 වන දින සංගමයේ විධායක කමිටුව හා මහ බැංකු අධිපතිතුමා අතර පැවැත්වුණු සාකච්ඡාව යම් සාධනීය ලක්ෂණ පෙන්නුම් කරන්නක් බව හෙළිකළ ගරු සභාපතිතුමා, මහ බැංකු පාලනාධිකාරයත් විශ්‍රාමික සංගමයත් අතර හොඳ සහයෝගීතාවයක් ගොඩ නැගී ඇති බව ප්‍රකට වන්නේයැයි පැවසීය. සංගමයේ ඉල්ලීම්වලට යහපත් ප්‍රතිචාරයක් දැක්වීමට අධිපතිතුමාගේ ඇති නැඹුරුව අප විසින් වඩාත් හෘදයාංගමව අගය කළ යුතුව ඇතැයි සභාපතිතුමාගේ විශ්වාසය විය.

ඈත මෑත විශ්‍රාම වැටුප් අතර යම් අසමතුලිතතාවක් විද්‍යාමාන වන බව මහ බැංකු අධිපති තුමාගේ ද අවධානයට යොමු කෙරී ඇති බව ප්‍රකාශ කළ ගරු සභාපති ද සිල්වා මහතා මෙම අවුල විසඳීම සඳහා නව යෝජනා මාලාවක් ඉදිරිපත් කරන්නැයි අධිපතිතුමා පැවසූ බව සඳහන් කරමින් 2015 මහ බැංකු වැටුප් වැඩි කිරීම් අවස්ථාවේ දී එම යෝජනා වඩාත් අර්ථවත් ලෙස සලකා බැලීමට ඒ'තුමාගේ අවධානය යොමු වනු ඇතැයි විශ්වාසය පළ කළේය. දැනටමත් සංගමය එවැනි නව යෝජනාවලියක් සකස් කිරීමෙහිලා යොමුව ඇතැයි හෙතෙම වැඩි දුරටත් හෙළි කළේය.

ඔක්තෝම්බර් 13 වන දා මානව හිමිකම් කොමිසම හමුවෙහි සංගමයේ ඉල්ලීම සලකා බැලුණු අවස්ථාවන්හි දී ද විශ්‍රාම වැටුප් ලබන්නන් අතර ඉස්මතුව ඇති අසමතුලිතතාව සමනය කිරීමට යම් ප්‍රායෝගික ක්‍රියාවලියක ඇති අවශ්‍යතාවය අවධාරණය කෙරුණු බව ද හෙළි කෙරිණි. විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව රාජ්‍ය අංශයේ මතුව ඇති ධෛර්යසම්පන්න ප්‍රවණතා කෙරෙහි ද අපගේ අවධානය යොමු විය යුතු බවත්, නොඑසේ වුවහොත් අප හුදෙකලා පරාජිතයින් විය හැකි බවත් සභා රැස්වීම් තුළදී ඉස්මතු කෙරුණු අදහසකි. කෙසේ වෙතත් මහ බැංකු විශ්‍රාමිකයන්ගේ වැටුප් අර්බුදය විසඳා ගැනීමට අවශ්‍ය කෙරෙන සංවිධානාත්මක ශක්තිය ගොනු කර ගැනීමට මෙම ප්‍රාදේශීය නියෝජිත සංකල්පය මහෝපකාරී වන බව සියලු සභිකයන්ගේ පිළිගැනීම විය.

මහ බැංකු විශ්‍රාමිකයෙකුගේ අභාවයක දී මහ බැංකුව වෙනුවෙන් පිරිනැමෙන මල් වඩම අදාල ස්ථානය කරා ප්‍රවාහනය කොට ගෞරවනීය ලෙස තැන්පත් කිරීමේ කාර්යය මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයට පැවරී

ඇති හෙයින් ඒ සඳහා දැරීමට සිදුවන වියදම කාලීන තත්වයන් මත සංශෝධනය විය යුතුව ඇති බවට සංගමය විසින් කරනු ලැබූ ඉල්ලීමට අධිපතිතුමාගෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇති බව ද සභාපති තුමා දැන්විය.

ඒ ඒ ප්‍රදේශයන් හි මහ බැංකු විශ්‍රාමික අභාවයක් සිදු වූ විට ඒ සම්බන්ධව සංගම් මූලස්ථානය දැනුවත් කොට මහ බැංකුව වෙනුවෙන් ශෝක ප්‍රකාශිත මල්වඩමක් තැන්පත් කිරීමේ කාර්යය මෙම ප්‍රාදේශීය නියෝජිතයින්ට පැවරෙන මහගු වගකීමකි. එහි දී දැරීමට සිදුවන වියදම ඉතාමත් ම ඉක්මණින් අදාල නියෝජිතයා වෙත ගෙවීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය විසින් භාර ගනු ඇත.

විශ්‍රාමික සංගමයේ සමාජිකත්වය දරණ අයෙකුගේ අභාවයක දී ප්‍රදර්ශනය කිරීම සඳහා සම්පාදිත පොදු බැනරයක් සියලුම ප්‍රාදේශීය නියෝජිතයන් අතර බෙදා හැරීමට සංගමය කටයුතු සලසා ඇත. එහි ප්‍රථම අදියර වශයෙන් මෙදින රැස්වීමට පැමිණ සිටි නියෝජිතයන් වෙත එකී බැනරය බැගින් බෙදා දෙන ලදී. එම බැනරය අදාල තැන්හි ප්‍රදර්ශනය කරවීම හා ආපසු සුරක්ෂිතව ලබා ගැනීම සඳහා ක්‍රම වේදයක් ඒ ඒ නියෝජිත මහතා හෝ මහත්මිය විසින් සලසා ගත යුතුය.

අභාවයට පත් වූ සමාජිකයා හෝ සාමාජිකාව වෙනුවෙන් සංගමය විසින් ගෙවනු ලබන අවමංගල්‍යාධාර දීමනාව එම යැපෙන්නන් වෙත ඉක්මණින් ලබා දීම සඳහා ප්‍රාදේශීය නියෝජිත සහය විශ්‍රාමික සංගමයට අත්‍යවශ්‍ය වන බවත්,
සංගමයේ සාමාජික අසාධ්‍ය රෝගියෙකු බැලීම සඳහා රු. 5000/- ක වියදමක් දැරීමට සංගමය සූදානම්ව සිටින බවත් ගරු සභාපතිවරයා සිහිපත් කළේය.

දැනට සකසා ඇති ප්‍රාදේශීය සාමාජික ලැයිස්තු වල ඇතුලත් සාමාජික සාමාජිකාවන් හා ප්‍රාදේශීය නියෝජිතයන් අතර දැන හැඳුනුම්කමක් හා අන්තර් සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීම පිණිස යම් සුහද හමුවීමක් ඒ ඒ ප්‍රදේශයන් හි සපයා ගත හැකි පහසුකම් මත සංවිධානය කර ගත හැකිය. අවශ්‍ය වූ සෑම විටෙකම මෙම හමුවීම්වලට සහභාගිවීම පිණිස සංගමයේ විධායක කමිටු නියෝජිතයෝ සූදානම් ව සිටිති. ඇත්තෙන්ම සංගමයේ තීන්දු තීරණ හා අදහස් ආකල්ප සියලුම සාමාජිකත්වය සිසාරා පැතිර වීමටත්, තවදුරටත් ඈත එපිට සාමාජික අදහස් උදහස් මූලස්ථානය වෙත කැඳවා ගැනීමටත් මෙම ක්‍රියාකාරීත්වය ඉමහත් සේ උපකාරී වනු ඇත. මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ලැබ, එහෙත් තවමත් ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සංගමයෙහි සාමාජිකත්වය නොලැබ සිටින්නවුන් හා අලුතෙන්ම විශ්‍රාම යන්නවුන් සමිති මධ්‍යස්ථානය වෙත කැඳවාගෙන ඒමත් ප්‍රාදේශීය නියෝජිතයන්ගෙන් අපේක්ෂිත මෙහෙවරකි. දායකත්ව අවමංගල්‍යාධාර වැඩ පිළිවෙල සාමාජිකත්වය අතර ප්‍රචලිත කිරීම ද එවන් තවත් අපේක්ෂාවකි. මේ සඳහා අවශ්‍ය කෙරෙන අයදුම්පත් ඡායා පිටපත් වශයෙන් සකසා ගත හැකිය. එසේම ගරු ලේකම් ඇමතීමෙන් ද එම අයදුම්පත් ලබා ගැනීමට අවකාශ ඇත.

ඒ ඒ සම්බන්ධතාවන් හඳුනාගැනීමටත්, ඒ ඔස්සේ ශක්තිමත් සාමාජික ජාලයක් ගොතා ගැනීමටත්, පහසුවන පරිද්දෙන් දැනට සකස් කොට ඇති ප්‍රාදේශීය නියෝජිත නාමාවලිය හා අදාල තොරතුරු ඉදිරි පිටුවේ දැක්වේ. මෙම ප්‍රාදේශීය බෙදීම නියෝජිත අදහස් සැලකිල්ලට ගනිමින් තවදුරටත් සංශෝධනය වීමට අවකාශ ඇත. එමෙන්ම අවශ්‍ය අවස්ථාවක දී තමන් නියෝජනය කරනු පිණිස අතිරේක සමාජිකයෙකු හෝ සාමාජිකාවක සහභාගී කර වීමට ද අවසර ඇත.

රට පුරා රාජ්‍ය සේවාවේ හා අනුබද්ධ ආයතනවල විශ්‍රාමිකයන් කාලීන ජීවන ගැටළුවලට විසඳුම් සොයමින් සංවිධානය වී උද්ඝෝෂණ ව්‍යාපාරයන්ට අවතීර්ණව සිටිති. පැරණි විශ්‍රාමිකයන්ගේ වැටුප් අද තත්වයට කෙසේවත් ඔරොත්තු නොදෙන බව පුන පුනා කිව යුත්තක් නොවේ. සමාන ශ්‍රේණියේ එදා විශ්‍රාම වැටුපත් අද විශ්‍රාම වැටුපත් අතර ඇත්තේ බරපතල විෂමතාවයකි. මේ විෂමතාවය ඉවත් කොට යාවත්කාලීන වැටුප් ව්‍යුහයක් සකසන ලෙස සියලු විශ්‍රාමිකයෝ අදාල බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති. මේ පිළිබඳ රාජ්‍ය අංශයෙන් වරින් වර දැක්වුණු යහපත් ප්‍රතිචාරයන්ගේ උච්ච අවස්ථාව 2015 අය වැය ලේඛණය ඉදිරිපත් කරමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙසේ ප්‍රකාශ කළේය. ''රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමේ දී ඊට පෙර විශ්‍රාම ලැබූවන්ගේ වැටුප් අතර ඇතිවන විෂමතාවය ඉවත් කිරීම සඳහා ඔවුන් ඉල්ලා ඇති 2006 වැටුප් පදනම මත නොව 2015 සඳහා මා යෝජනා කළ වැටුප් ව්‍යුහයටම ගලපමින් මුළුමනින්ම විසඳීමට ද යෝජනා කරනවා. මින් පසු විශ්‍රාම වැටුප් විෂමතාවයක් මේ නිසා ඇති නොවන අතර සියලු විශ්‍රාමික වැටුප් 2015 නව වැටුප් ව්‍යුහයට අනුකූලව සකස් කරනු ලබනවා''.

| ප්‍රදේශය | නියෝජිත නම | ලිපිනය හා දුරකථන අංක |
|---|---|---|
| 1 වැල්ලවත්ත | ඩී.සී.පී. රාජපක්ෂ මයා (996) | 31/2, පී.එස්. ප්‍රනාන්දු මාවත, වැල්ලවත්ත. 071 8106954 / 0112 582220. |
| 2 මොරටුව | බී.එස්.බී.සී. මෙන්ඩිස් මයා (3208) | 24/1, 5 වන සාගර පටුමග, උයන, මොරටුව. 011 2644449/ 077 8259796 |
| 3 පානදුර | නිමල් කුරේ මයා (837) | 25, වීරමන් පාර, පානදුර. 038 2234821 |
| 4 ගාල්ල | එල්. එදිරිසිංහ මයා (3364) | දෙල්ගහවත්ත, බද්දේගම දකුණ, බද්දේගම. 091 2292937/ 071 8213919. |
| 5 මාතර | එස්.ජේ. ගුණවර්ධන මයා (3185) | 134, කරුවල බැද්ද වත්ත, ලැබීම, කඹුරුගමුව. 041 2226310/ 071 8671410. |
| 6 නුගේගොඩ | ඩබ්.එච්. ගුණරත්න මයා (3089) | 3, දෙවන පටුමග, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ. 011 2823065/ 077 7894453. |
| 7 මහරගම/හෝමාගම | ආර්.එම්. සෙනෙවිරත්න මයා (767) | 172/4, ඇල්විටිගල මාවත, ඇරැව්වල, පන්නිපිටිය. 011 2845054. |
| 8 කඩවත | ආර්.ඩී. ගුණසේන මයා (3628) | 364/ඒ, පීනසේන මාවත, මහර, කඩවත. 011 2901891/ 071 8026411 |
| 9 ගම්පහ | ඩී.ආර්. දයාවංශ මයා (3312) | 24/20, වික්‍රම පෙදෙස, බණ්ඩාරවත්ත, ගම්පහ. 033 2226352/ 077 3462403. |
| 10 මහනුවර | ඒ.ආර්.එම්. බිස්තාමින් මයා (3508) | 273/9 බී, කටුගස්තොට පාර, මහනුවර. 081 2233792. |
| 11 ජා ඇල | පී.එෆ්. එල්. පෙරේරා මයා (595) | 77/2 කල්වාරි පාර, ජා ඇල. 011 2235468/ 077 9730442. |
| 12 මීගමුව | ජේ.එම්. සිල්වා මයා (709) | 20, විජයපාල මෙන්ඩිස් මාවත, මීගමුව. 031 2234413. |
| | කේ. එන්. ඩබ්. ප්‍රනාන්දු මයා (999) | 40, ලෙයිටන් පටුමග, මීගමුව. 031 2233728 |
| 13 අනුරාධපුරය | පී. වික්‍රමසිංහ මයා (3738) | 3185/9, 3 වන පියවර, අනුරාධපුරය. 025 2220800 /077 8814806. |
| 14 බොරලැස්ගමුව | ඩී.ජේ. වික්‍රම මයා (842) | 90 ට, විහාර මාවත, බෙල්ලන්විල. බොරලැස්ගමුව 011 2731041 / 071 8290316. |
| 15 පිළියන්දල | එච්.ජේ. විමලසෝම මිය (646) | 309/1, වටනා වත්ත පාර, මාම්පේ, පිළියන්දල. 011 2614717/ 071 8328627. |
| 16 කඩුවෙල | ඩබ්.පී.හේමපාල මයා (3330) | 1006/10, තලංගම උතුර, ගෝන වත්ත පාර, මාලඹේ. 011 2562220. / 0718111789 |
| 17 අංගොඩ | කේ. ඩී.කේ. ගුණසේකර මයා (832) | 60/500, රුවන්පුර, අත්ගොන, අංගොඩ. 011 2792045 |
| 18 කෝට්ටේ | පියසේන ගජධීර ආරච්චි මයා (968) | 36, රජමාවත, රජමහා විහාර පාර, පිටකෝට්ටේ. 011 2811969 / 071 0165224. |

රටේ උත්තරීතර නායකයා විශ්‍රාමිකයන් උදෙසා සානුකම්පිතව බැලීම සමස්ථ විශ්‍රාමික ජනතාවගේ ම වාසනාවකි. රාජ්‍යානුබද්ධ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ද විශ්‍රාම වැටුප් අරභයා රජයේ ප්‍රතිපත්තයානුකූල පියවර ඔස්සේ ගමන් කරනු ඇතැයි වරක් දෙවරක් නොව, තුන් වරක් විශ්වාසය රඳවා සිටිමු.

අප එපමණකින් නොනැවතී මෙම විශ්‍රාම වැටුප් අර්බුදය සමථයකට පත් කර ගැනීම සඳහා අපේ සාමූහික සංවිධාන ශක්තිය මහ බැංකු පාලනාධිකාරිය වෙත පිරිනමමු. එපමණක්ද? නැත. එක හා සමාන ගැටළුවක් විසඳා ගැනීම සඳහා රටේ සමස්ථ විශ්‍රාමික ජනතාවම ඉදිරියට යන මොහොතක මහ බැංකු අභිමානයෙන් හුදෙකලා නොවී අපි ද සම කොටස් කරුවෝ වෙමු. ප්‍රාදේශීය නියෝජිත ක්‍රියාකාරීත්වය ඔස්සේ සියලුම මහ බැංකු විශ්‍රාමිකයන් ශක්තිමත් ගාමක බලවේගයක් වශයෙන් එක් රැස් කිරීම අපේ අධිෂ්ඨානය විය යුතුය.



**සේ. දො. කරුණාරත්න**
**071 8178234**
ප්‍රාදේශීය නියෝජිත සම්බන්ධීකාරක.

වසර 2014 කට පෙර සිදු වූ කිතු උපත සමරන මේ උඳුවප් මාසයේ කිතු අනුගාමිකයෙකු වූ අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා විසින් රචිත යැදුමක් ඔබට ඉදිරිපත් කිරීමට මා හට සිත් විය එය මෙසේය

## ''සාමයේ යැදුම''

දෙවි සමිඳුනි
මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව
වෛරය ඇති තැන ප්‍රේමය ද
වරද ඇති තැන සමාවද
අසමගිය ඇති තැන සමගිය ද
අවිශ්වාසය ඇති තැන විශ්වාසය ද
දිරි බිඳුනු තැන බලාපොරොත්තුව ද
ශෝකය ඇති තැන ප්‍රීතිය ද
වැපිරීමට මට වරම් දුන මැනව



මාගේ ගුරු දේවයාණෙනි
මට සැනසීම පතනවාට වඩා
අසරණයන්ට සැනසීමක් වන්නට ද
මාව තේරුම් ගැනීමට වඩා
මා අන් අය තේරුම් ගැනීමට ද
ආදරය ලබනවාට වඩා ආදරය දීමට ද
මට පිහිට වුව මැනව


**ඉවෝන් අමරසේකර** (602)
(0112-645162)


## දැනුම්දීමයි.

"සෑදෑව" හි පළකෙරෙන ලිපි හා අදහස් ආදියෙහි වගකීම ඒ ඒ රචකයා සතුවේ. සංස්කාරක සටහන් හැර අනෙකුත් රචනා පිළිබඳව සංස්කාරක මඩුල්ල හෝ විධායක කමිටුව වගකීම භාර නොගනී.

-සංස්කාරක-

## ජයග්‍රාහී ජීවිතය

ඔබේ ජීවිතයෙන් යමක් කිරීමට,
ඔබේ කාලය පැමිණ ඇත.
මොහොතක් ඔබ ගැන සිතන්න.
ඔබේ අනාගතය දෙස බලන්න ඔබගේ සිහිනයක් නිර්මාණය කරන්න.
ඉන් ඔබට සාර්ථක වන්නට නම්, ඒ සඳහා පියවර තබන්න.
වඩාත් සුදුසු තීරණ ගන්න.
ඔබගේ  ජීවිතය ඒ සමඟ දියත් කරන්න.
යොදන්න ඔබේ හැකියාව,
සෑම දිනකම හැකියාවන් හා අවස්ථාවන් ඇත.
එය හඳුනා ගෙන එය කරා යන්න.
පියාපත් දිගහැර ඉහළට යන්න. වැටේ යැයි බිය නොවන්න.
සාර්ථකත්වයේ රහස යහපත් ක්‍රියාවයි.
කළයුතු දේ ගැන සිතා ගැඹුරින් එය ආරම්භ කොට සාර්ථකව කරන්න.
අවශ්‍ය නම් වෙනස් කරන්න.
නොහැකිදේ හැකිදේ බවට ගොඩ නගන්න.
එමගින් ඔබගේ ජීවිත තරඟය ජය ගන්න.




**චාලට් දසනායක -3124**
**0715172973**

# තිස් පස් වසරක මතක සටහන්

1963 වසරේ පුවත්පත් මණ්ඩලයේ තාවකාලික ලඝු ලේඛක ලෙස මුල් පත්වීම ලැබූ මා 1964 ජනවාරි 01 වැනි දින ජාතික කිරි මණ්ඩලයේ ප්‍රථම සිංහල ලඝු ලේඛක තනතුර හිමිකර ගැනීමේ වාසනාව ලැබුවෙමි. අනතුරුව මහජන බැංකුවේ පත්වීම ලැබුනත් 1967 වසරේදී මහ බැංකු සේවාවට එක්වුනෙමි.

## ලේකම් දෙපාර්තමේන්තුවට

මහ බැංකු සේවාවට එක් වූ මා ප්‍රථමයෙන් ලේකම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී. එදා ලේකම් දෙපාර්තමේන්තුවට ආයතන අංශය, මුදල් අංශය, සුභ සාධන අංශය, පරිශ්‍ර අංශය, නීති අංශය සහ සැපයුම් අංශය අයත් විය. (අද මේ සියල්ල දෙපාර්තමේන්තු වශයෙන් බෙදා වෙන් කර ඇත.) A. E. P. ගුණසේකර මහතා ලේකම් වශයෙන් ද, එරමුදුගොල්ල මහතා නියෝජ්‍ය ලේකම් වශයෙන් ද කටයුතු කරන ලදී. එවකට සිංහල ලඝු/ යතුරු ලියන අංශයේ ජ්‍යේෂ්ඨතමයා වූයේ B.S. පෙරේරා මහතාය. ඔහු විසින් මට ලබා දුන් යතුරු ලියනය, සිංහල යතුරු ලියන ලංකාවට හඳුන්වා දුන් කාලයේ ගත් එකක් බව මට හැඟේ. කෙසේ වෙතත් මාස්පතා පැමිණෙන යතුරු ලියන සේවාකරුවන් ලවා එම යන්ත්‍රය මට අවශ්‍ය පරිදි සකස් කර ගතිමි. පසු කාලයකදී මෙම යන්ත්‍රය මට "ඉටු දෙවියෙක්" විය. ස්ථාන මාරුවීම් ලැබූ සෑම දෙපාර්තමේන්තුවකට ම මම මෙම යතුරු ලියනය රැගෙන ගියෙමි. මා මාණ්ඩලික පංතියට උසස්වීම් ලැබූ පසු ලඝු/ යතුරුලියන වැඩ කටයුතුවලින් ඈත් වීමට සිදු වුවත් 2001 සැප්තැම්බර් 05 දින මා විශ්‍රාම යනවිටත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින් වෙනුවෙන් මට ලබාදුන් මේසයේ එක් කොනක එය තබා ගැනීමට තරම් මම කාරුණික වීමි.

1968 ජූලි 25 බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවේ පැවති හැංසාඩ් වාර්තාකරුවෙකුගේ තරඟ විභාගයට මම සහභාගි වීමි. ඒ අතර මහ බැංකුව ගිනි ගන්නා බව මට කණින් කොනින් අසන්නට ලැබුණි. විභාගය උඩින් පල්ලෙන් ලියා දැමූ මම වහාම මහ බැංකුව දෙසට පැමිණියෙමි. කෙසේ වෙතත් ඉදිරිපස තිබූ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ලබන නිලධාරින් පොලිස් පවුරක් මෙන් සැදී කිසිවකුටත් බැංකු පරිශ්‍රයට පිවිසීමට ඉඩ නොදුනි. න.බ. කුලසේකර සහ තවත් නිලධාරින් සවුන්වරයේ තිබූ මුදල් රැගෙන හනිකට ගමන් කරන ආකාරය මම දුටුවෙමි. එහෙත් එම මුදල් එපරිද්දෙන් ම පසු දින බැංකුව වෙත භාර දී තිබුණි.

ලේකම් දෙපාර්තමේන්තුවේ ලඝු යතුරු ලියන වැඩ වලට අමතරව, සේවකයන් සම්බන්ධව පැවැත්වූ විනයානුකූල පරීක්ෂණ බොහොමයක් සටහන් කොට යතුරුලියනය කරදීම මට පැවරී තිබුණි.

මහ බැංකු වාර්ෂික වාර්තාව සකස් කරන කාලයේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට තාවකාලිකව අනුයුක්ත කරන මට එම කාර්යයට ද දායක වන්නට සිදුවිය.

## බැංකු කටයුතු දෙපාර්තමේන්තුවට

1971 සැප්තැම්බර් 03 දින බැංකු කටයුතු දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවක් ලැබුණි. K. ගුණරත්නම් මහතා ප්‍රධාන ගණකාධිකාරී විය. A. බණ්ඩාරනායක මහතා නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී විය. බැංකු කටයුතු දෙපාර්තමේන්තුව මට ඉතාමත් සුන්දර ස්ථානයක් විය. නොයෙල් රණසිංහ, ක්‍රිස්ටි සිල්වා මට බෙහෙවින් හිතවත් වූ නිලධාරින් වූහ. ටික කලකදී ක්‍රිස්ටි සිල්වා මහතා යම්කිසි අසනීපයකින් හදිස්සියේ අභාවප්‍රාප්ත වීම ඉතාමත් ශෝක ජනක කරුණක් විය.

හෙක්ටර් ජයවර්ධන මහතා ඉදිරිපස දොරටුවෙන් පැමිණෙන බව පිටුපස සිටින අයට හඳුනා ගත හැකිය. ඒ තරමට සුවඳ විලවුන් ඇඟ ගල්වා පැමිණෙන නිසාය. ජයවර්ධන මහතා, බණ්ඩාරනායක මහතාගේ දුරකථනය නාද කොට කිසිවක් නොදන්නා සේ රිසිවරය ආපසු තබා සිය අසුනෙන් නැගිට යයි. මෙය බණ්ඩාරනායක මහතාට හිසරදයක් වුවත්, අපට විනෝද ජනක සිද්ධියක් විය.

එකල මාස්පතා මාසික ශේෂ පත්‍රය සිංහලෙන් ටයිප් කිරීමේ කාර්යය මට පැවරී තිබුණි. එහි එක අකුරක් හෝ ඉලක්කමක් වැරදී ගියොත් නැවත නැවතත් ටයිප් කළ යුතුය. "ටිපෙක්ස්" ගා මැකීම හෝ ඉරේස් කිරීම නොකළ යුතුය. කෙසේ වෙතත් කිහිප විටක් නැවත ටයිප් කිරීමේ අකරතැබ්බයට මුහුණ දීමට මට සිදු විය.

ඉංග්‍රීසි ශේෂ පත්‍රය සකස් කෙරුනේ ෂවාහීර් මහතා අතිනි. ඔහු ශේෂ පත්‍රය කොටසක් ටයිප් කර, අසුනෙන් බැහැරව පල්ලියට ගොස් යාඥා කර නැවත පැමිණ සිය කාර්යය නිම කරයි.

## රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට

1975 නොවැම්බර් 05 වැනි දින රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවක් ලැබුණි. එම දෙපාර්තමේන්තුව ද කාර්ය බහුල ස්ථානයක් විය. ආචාර්ය S. T. G. ප්‍රනාන්දු මහතා රාජ්‍ය ණය අධිකාරී වශයෙන් ද, P. අමරසිංහ මහතා නියෝජ්‍ය රාජ්‍ය ණය අධිකාරී වශයෙන් ද කටයුතු කළහ. S. T. G. ප්‍රනාන්දු මහතා සැර පරුෂ කෙනෙක් හැටියට ඇතමුන් හැඳින්වුව ද, ඔහු මට ඉතාමත් කාරුණික මහත්මයෙක් විය. 1979 අගෝස්තු 01 වැනි දින සිට මාණ්ඩලික නොවන පංතියේ iv වැනි ශ්‍රේණියට මට උසස් වීමක් ලබා ගත හැකි වූයේ එතුමාගේ නිර්දේශයක් නිසාමය.

## අභ්‍යාස විද්‍යාලයට

1982 මැයි මස 17 දින මා කොල්ලුපිටියේ බගතලේ මාවතේ පිහිටා තිබූ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයට අනුයුක්ත කරන ලදී. බගතලේ පිහිටි එක්තරා බංගලාවක මෙම අභ්‍යාස විද්‍යාලය ස්ථානගත කොට තිබූ අතර, ඉතා කුඩා කාර්ය මණ්ඩලයක් සේවය සඳහා යොදවා තිබුණි. එම නිසා අපි එකම පවුලක් ලෙස මෙහි සේවය කළෙමු.

ආචාර්ය G. M. අබයරත්න මහතා පළමු අධ්‍යක්ෂ ලෙස ද A. M. S. රදලියගොඩ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස ද කටයුතු කරන ලදී. මෙහි පැවැත් වූ පාඨමාලා වැඩි කොටසක් සිංහල මාධ්‍යයෙන් පැවැත්වූ අතර, සහභාගි වන්නන් විසින් සකස් කරන ලද ව්‍යාපෘති වාර්තා වැඩි ප්‍රමාණයක් “ස්ටෙන්සිල් ” කැපීම මා අතින් සිදුවිය. පසු කලෙකදී මෙම අභ්‍යාස විද්‍යාලය රාජගිරියේ තනන ලද විශාල ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. මාගේ අධීක්ෂණය යටතේ සේවය කළ රම්‍යා, නමීරා, චම්පා සහ විද්‍යාලයේ අනිකුත් සහෝදර කාර්ය මණ්ඩලය මේ අවස්ථාවේදී මාගේ සිහියට නැගේ. කෙසේ වෙතත් අභ්‍යාස විද්‍යාලයේ වැඩ කටයුතු අධික වූ බව නම් නොකියාම බැරිය. මාතර, මහනුවර පොල්ගොල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, බණ්ඩාරවෙල ආදී නගරවලදී පැවැත් වූ සති 2 ක පුහුණු පාඨමාලාවකට සහභාගි වූ මා හට සමහර දිනවල උදේ, සිට මධ්‍යම රාත්‍රිය දක්වා ව්‍යාපෘති වාර්තා හත අටක් “ස්ටෙන්සිල්” කර අවසන් කිරීමට සිදු විය.

විද්‍යාලයේ දෙවැනි අධ්‍යක්ෂ ධූරයට පත් ආචාර්ය M. U. A. තෙන්නකෝන් මහතා මෙහිදී ඉතාමත් කෘතවේදීව සිහිපත් කළ යුතුමය. 1990 ජනවාරි 11 දින මට මාණ්ඩලික පංතියට උසස් වීමක් ලැබුනේ අභ්‍යාස විද්‍යාලයේ සේවය කරන අතරතුරය.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ J. E. D. කරුණාරත්න මහතාගේ ඉල්ලීම මත 1995 සැප්තැම්බර් 15 දින ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවක් ලැබුණි. 1996 ජනවාරි 31 දින මහ බැංකුවට කොටි ත්‍රස්තයන් බෝම්බ ප්‍රහාරය එල්ල කළ දිනය විය. මෙම ප්‍රහාරයෙන් වැඩිම හානි සිදු වූයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවටය. පුස්තකාලයේ සියළුම පොත්පත් විනාශ විය. පාලන අංශයේ S. A. කරුණාරත්න මහතාගේ ජීවිතය හානි විය. පාලන අංශයේ පියදාස විජේසිංහයන්ගේ දෙඇස් අන්ධ විය. එම බෝම්බ ප්‍රහාරයේදී මාගේ දකුණු පස පද්මාංජලීත්, වම්පස පද්මිණිත් සිටි අතර, පස් කඩා වැටී සමහරු ඊට යට වූහ.

බෝම්බ ප්‍රහාරයෙන් පසු තුවාල ලැබූ අප තිදෙනා කෙසේ හෝ එළියට යාමට උත්සාහ කළ අතර, එළිය පෙනෙන එක්තරා ස්ථානයක් දැක ගත හැකි විය. දරු ප්‍රසූතියට සූදානම්ව සිටි පද්මාංජලී වත්තම් කරගෙන මම එළියට පැමිණියෙමි. ඊට පසු වාහන වලින් අප ඇතුළු තුවාල කරුවන් කොළඹ මහ රෝහල වෙත ගෙන යන ලදී. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහ බැංකුවේ මිය ගිය අයගේ විස්තර එහිදී යාන්තමින් මට දැනගත හැකි විය.

බෝම්බ ප්‍රහාරයෙන් පසු අප මුහුණ පෑ කම්කටොළු අනේකවිධ වුවත්, ඒ සියල්ල මෙහි සටහන් කිරීමට නොහැකි වීම ගැන කණගාටු වෙමි.

මෙම ලිපිය ලියන අවස්ථාව වන විටත් මාගේ අක්මාවේ හටගෙන ඇති දරුණු පිළිකා රෝගයකින් පීඩා විඳිමින් පසු වෙමි. දැනට වෛද්‍ය ප්‍රතිකාර ලබමින් වැඩි කාලයක් ඇද මතට වී කාලය ගත කරමි. ජීවිතයේ වැඩි කාලයක් විනෝදයෙන් ගත කළ මට ඊළඟ “සැදෑව” සඟරාවටත් ලිපියක් ලිවීමට හැකිවේද?

පී. කේ. නෝටන් පෙරේරා
(980)
034-226914
071-8206957



# මෙතේ බුදුන් දැක නිවන් දකිමුද ?
# නැතහොත් මෙම භවයේදීම නිවන් දකිමුද ?

ශ්‍රී ලංකාවේ අද්‍යවන විට විශාල ධර්ම ප්‍රබෝධයක් ඇතිවී පැවතීම සතුටට කරුණකි. දිවයිනේ අස්සක් මුල්ලක් පාසා විවිධ තරාතිරමේ ධර්ම දේශනා සහ පින්කම් සිදුකරනු ලැබේ. බුදුරජානන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ සුවාසූ දහසක් ධර්මස්කන්ධය විවිධ තරාතිරම් විවිධ අවස්ථා සහ පුද්ගලයින් අනුව දේශනා කරඇත. ඉන් තමන්ට අදාලවන දහම් කරුණු තෝරා බේරා අවබෝධ කරගැනීමට නො හැකිව බොහෝ පිරිස් මුලාවී ඇත.

බුද්ධෝත්පාද කාලයක මිනිසත්බව ලැබ ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා සමන්විතව මාර්ගඵල ලාභී ආර්ය උතුමන් පහළව ඇති අතිශය දුර්ලභ අවස්ථාවක ජීවත්වන අපි ඉතාමත් වාසනාවන්තයෝ වෙමු. ශ්‍රී සද්ධර්මය ශ්‍රවණයකර නිවන්මගට අවතීර්ණ වීමට අවස්ථාව සැළසී ඇති බැවින් ඒ සඳහා ඔබගේ අවධානය යොමුකිරීම මේ ලිපියේ අරමුණවේ.

බුදුරජානන්වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේ මෙන්ම පසුකාලීනව ද සෝවාන් ආදී මාර්ගඵල ලාභීන් විශාල පිරිසක් වැඩවිසූ බව ත්‍රිපිටකයේ මෙන්ම අනෙකුත් ධර්ම ග්‍රන්ථ වල සඳහන්ව ඇත. අද සෝවාන් ආදී මාර්ග ඵල ලබාගැනීම කළ නො හැක්කක් බව ඇතමුන්ගේ හැඟීමය. එබැවින් බුද්ධෝත්පාද කාලයක ජීවත්වෙමින් මෛත්‍රීබුදුන් දැක නිවන් දැකීමට ප්‍රාර්ථනා කරති. ධර්මය අවබෝධ නො වීමට සහ මාර්ග ඵල ලාභීන් බිහි නො වීමට හේතුවන මූලික දහම් කරුණු වැරදි ලෙස භාවිතය සහ අර්ථ නිරූපනය වී ඇතිදැයි සළකා බැලීම වටී. ධර්මය විස්තර කිරීමට අර්ථ,ධර්ම,නිරුක්ති,පටිභාන යන කරුණු හතර අවශ්‍යවේ. බුදුන් වහන්සේ අනුදැන වදාලේ තමන්වහන්සේ විසින් දේශිත භාෂාවෙන් වෙනත් බසකට ධර්මය නො නැගිය යුතු බවයි. පහත සඳහන් චුල්ල වග්ග පාළි 2 පිටුව 10 පාඨය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරන්න.

තෙන ඛො පන සමයෙන යමේළුතෙකුලා නාම භික්ඛූ දෙව භාතිකා හොන්ති බ්‍රාහ්මණජාතිකා කල්‍යාණවාචා කල්‍යාණවාක්කරණා. තෙ යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසංඞකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසිදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:'' එතරහි භන්තෙ භික්ඛූ නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා. තෙ සකාය නිරුත්තියා බුද්ධ වචනං දූසෙන්ති, හන්ද මයං භන්තෙ බුද්ධවචනං ඡන්දසො ආරොපෙමා ''තිං. විගරහි බුද්ධො භගවා ''කථං හි නාම තුමෙහ මොඝපුරිසා එවං වක්ඛථ හන්දමයං භන්තෙ බුද්ධවචනං ඡන්දසො ආරොපෙමා ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භියොභාවාය. අථ ඛෙවතං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තාය'' ති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''න භික්ඛවේ බුද්ධවචනං ඡන්දසො ආරොපෙතබ්බං. යො ආරොපෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවේ සකාය නිරුත්තියා බුද්ධ වචනං පරියාපුනිතුන්ති.''

එ සමයෙහි මිහිරි වචන ඇති මිහිරි කටහඬ ඇති බ්‍රාහ්මණ ජාතිකවූ යමෙතු ද තෙකුල ද නම් ඇති දෙබෑ මහණ කෙනෙක් වෙත. ඔහු භාග්‍යවතුන්වහන්සේ කරා එළඹුනාහ. එළැඹ ඔබ වැඳ පසෙක් ඉඳගත්හ. පසෙක උන්නාහුම ''වහන්ස දැන් භික්ෂුහු නානාවිධ නම් ඇත්තාහු, නානාගෝත්‍රයෙන්, නානාජාතියෙන් , නානාකුලයෙන් නික්මැ පැවිදිවුවාහු වෙත්. ඔහු ස්වකීය ව්‍යවහරයෙන් බුද්ධ වචනය දූෂිත කෙරෙත්. වහන්ස එබැවින් අපි බුද්ධ වචනය වෛදික භාෂාමය වාචනාමාර්ගයට නඟන්නම්හ ''යි කීහ. එ විට භාග්‍යවතුන් වහන්සේ ''හිස් පුරුෂයෙනි,තෙපි වහන්ස,අපි බුද්ධ වචනය වෛදික භාෂාමය වාචනාමාර්ගයට නඟන්නම්හ'' යි කෙසේනම් මෙබන්දක් කියව්හුද, හිස් පුරුෂයෙනි, මෙය නොපහන්වුවන්ගේ පැහැදීම පිණිස ද, පැහැදුණුවුන්ගේ වැඩීම පිණිස ද නොවේ. වැලිදු මහණෙනි, මෙය නො පැහැදුණවුන් ගේ නොපැහැදීම පිණිස ද පැහැදුණු ඇතැම් කෙනෙකුන්ගේ වෙනස්වීම පිණිස ද වේ යයි '' වෙසෙසින් ගැරහූ සේක. ගරහා දැහැමි කතාකොට, ''මහණෙනි, බුදු වදන ඡන්දසට (වෛදිකභාෂාවට) නොනැඟිය යුතු, යමෙක් එසේ නඟන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේය. මහණෙනි, මාගධික නිරුක්තියෙන් බුද්ධ වචනය පිරිවහන්නට අනුදනිමි''යි වදාළසේක.

බුදු දහමින් බලාපොරොත්තුවන්නේ ලෝක ස්වභාවය අවබෝධ කරගැනීමයි. ඒ සඳහා සතරක් වූ ඤාණං, දුක්ඛේ සමුදයඤාණං, දුක්ඛේ නිරෝධඤාණං, දුක්ඛේ

නිරෝධගාමිණිපටිපදාඤාණං අවශ්‍යවේ. මේ ඥාණ සතර ලැබීම වනම්, චතුරාර්ය සත්‍ය අවබෝධ වනුයේ ත්‍රිලක්ෂණය පිළිබඳ දේශනයක් අවසානයේ දීය. එසේ නම් බුදු දහමේ හරය අවබෝධයට ත්‍රිලක්ෂණය අත්‍යවශ්‍ය කරුණකි. මෙය සංස්කෘත භාෂාවට නැගීම ධර්මාවබෝධයට පාරාවල්ලක් වී ඇත. සංයුක්තනිකායේ 4 වෙනි කාණ්ඩයේ 2 වෙනි පිටුවේ අජ්ඣත්තානිච්ච සූත්‍රයේ තිලක්ඛණය භාවිතාකරමින් දේශිත පාඨයක මෙසේ සඳහන්වේ.

'' චක්ඛුං භික්ඛවේ අනිච්චං,යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛ තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙ සෝ'හමස්මි න මෙ 'සො අත්තානි, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

''මහණෙනි, ඇස කැමැතිසේ නො පවතී (අනිච්චයි). යමක් කැමතිසේ නො පවතියි ද එය දුකකි. යමක් දුක් දෙන්නවූ සුළු නම් එය (අසාර බැවින්) අනර්ථයි. අනර්ථවූ මමය මගේය ගැනීමට තරම් සුදුසු නොවේ. මෙසේ එය ඇති සැටියෙන් මනා නුවණින් දැක්ක යුතු ය.

වර්තමානයේදී බුද්ධ දේශනාවේ අර්ථය පැහැදිලි කරදීමට සංස්කෘත භාෂාව භාවිතය නිසා අනිච්ච යන පාලි වචනයට අනිත්‍ය නම් සංස්කෘත වචනය ද, අනත්ත යන පාලි වචනයට අනාත්ම යන සංස්කෘත වචනය ද භාවිතා කිරීම නිසා තිලක්ෂණයෙන් පැහැදිලි කරන්නාවූ ගැඹුරු සදහම් අරුත ගිලිහී ඇත. අනිත්‍යවූ යමක් සදාකාලික දුක් සහිත ද යන්න සළකා බැලිය යුතුය. වර්තමානයේදී අනිත්‍ය යන්න අර්ථ කථනය කර ඇත්තේ ස්ථිර නැති බවයි. (වෙනස්වනසුළු) බවයි.


ඔබ ගිලන් වූවායයි සිතමු. එම ක්‍රියාදාමය වෙනස් වීමේ (අනිත්‍ය) ක්‍රියාවකි. ඉන් ඔබට ඇතිවූයේ දුකකි. එසේම රෝගීවූ ඔබ සුවවීමට යෙදුනේද වෙනස්වීමේ (අනිත්‍ය) ක්‍රියාදාමයකිනි. දෙවැනි ක්‍රියාදාමය ඔබට සැප ගෙනදුන්නාට මේ අනුව සියළු අවස්ථාවන්ට අනිත්‍ය යන සංකල්පය යෙදුවහොත් එමගින් දුක මෙන්ම සැප ඇති වී ඇති බව ප්‍රත්‍යක්ෂවනු ඇත. මෙය ධර්මාවබෝධයට අවශ්‍ය කරුණු තේරුම්ගැනීමට බාධාවක් වන අතර ඉතා අවාසනාවන්ත තත්වයකි. එමෙන්ම සියලු සංස්කාරයෝ අනිත්‍ය යයි අර්ථ නිරූපනය කළහොත් මරණයද අනිත්‍ය බවට පත්වේ.මරණය නිත්‍යයි. නිත්‍යවූ මරණය ද දුකකි. අනිච්ච යන්න කැමතිසේ නැත යන අරුතින් ගතහොත් ප්‍රශ්නය නිරාකරණය නොවේද? වෙනස්වනසුලු ස්වභාවය විස්තරකිරීමට යොදාගෙන ඇති පාලි වචනය ''අද්දුව'' යන්නය.

බුදු පියාණන්වහන්සේ ආත්ම, අනාත්ම යන දෘෂ්ඨීන් බැහැර කළ සේක. ආත්මයක් ඇත යන්න ශාශ්වත දෘෂ්ඨියයි. ආත්මයක් නැත යන්න උච්ඡේද දෘෂ්ඨියයි. ඇත නැත යන දෙකම බුදුපියාණන්වහන්සේ අනුමත නො කළසේක. මේ දෙකම අයෝනිසෝමනසිකාරයේ නිගමනයන් බව මජ්ජිමනිකායේ සබ්බාසව සූත්‍රයේ ප්‍රකාශිතය. එම නිසා අසාරය, අනර්ථය. මමය මගේය ලෙස ගැනීම සුදුසු නො වන්නේය. අනත්ත යන්නෙහි විරුද්ධාර්ථය අත්ත යන්නයි. ලෝකය අනත්තයි. ආදීනව සහිතයි. නිවන අත්තයි ආදීනව රහිතයි. යන අකාරයට තේරුම්ගත යුතුය.

**නිවැරදි ත්‍රිලක්ෂණය**

| | | | |
|---|---|---|---|
| සියලු සංස්කාර | අනිච්ච<br>කැමතිසේ නැත | දුක්ඛ<br>දුකයි | අනත්ථ<br>අසාරයි |
| සියලු සංස්කාර | අනිච්ච<br>අනිත්‍යය ✗ | දුක්ඛ<br>දුකයි ✓ | අනත්ථ<br>අනාත්මයි ✗ |

සද්ධර්මය ශ්‍රවණයකර මෙම අත්බවෙහිම සෝවාන් ආදී මාර්ගඵල ලබා සසරදුකින් එතෙරවීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ඔබ යායුතු ස්ථානය විස්තර සහිතව දැනගැනීමට පහත සඳහන් දුරකථන අංකයට අමතන්න. ඔබ සැමට තෙරුවන් සරණයි.



**මහින්දරත්න ලියනගේ (3069)**
0755231954 / 0112 976784

# පැදි විදි

පැදි විදි





## මේ කඳුලැලි පිහාපං

වර්ෂය 1979 මහ බැංකු සමීක්ෂණය හොරොව්පතාන දී වැසි වැටී තිබුණද, චණ්ඩ සූර්යතාපය ගම්මානය දවාලන තරම්ය. අත වන ලැහැබෙහි අසල අතු සෙවිලි කළ කුඩා නිවසකි. මේ එහි සිටි තරුණයා අපට කී කථාව නොව ඇයට කියන කථාවයි.

වනපෙත දවා හිරු අවරට ගියෝයා
ඇතින් අවුත් බිං කරුවල වැටේයා
පැළ ළඟ ගහේ කොළ එක දෙක හැළේයා
වැව් කණ්ඩියේ උඹෙ සෙවණැලි පෙනේයා

හේනේ වැටේ පිපි මුදු මල් වැලේයා
හිරිමල් උඹේ හිනහව සිහි කෙරේයා
සිරි සිරි වැස්ස උඹෙ කටහඬ වගේයා
උඹ නැති එකේ පාලුව දැන් දැනේයා

උඹ වියු පැදුර තාමත් මගෙ පැළේයා
උණුහුම උඹේ තවමත් එහි තියේයා
තුන්පත් රෑලෙක සිහිනය බොඳ උනේයා
මට මෙහි ඉන්ඩ දැන්නම් සිත නොදේයා


හද හාවියට උඹෙ වං හුං කියාපං
වං හුං මගේ හිරවුන්ගෙන් අසාපං
උඹෙ සුදු අතින් මේ කඳුලැලි පිහාපං
වන දෙව් ලියක් වී මගෙ දුක නිවාපං



ගෝමි (624)
011 2926373

## සංවර්ධනය

කම්හලෙන් - වාහනෙන්
කඩපොලෙන් - වැඩපොලෙන්
නගරයෙන් - ගම්වලින්
වෙළඳ සංකීර්ණයෙන්
නිකුත් වූ ධූමයෙන්
රසායන ඕජසෙන්
තාපයෙන් - ද්‍රාවයෙන්
විසවුනේ ලෝකය යි



අංගාර - ගෙන්දගම්
ආදි සංයෝජනේ
ලෝකයට එක් කළේ
විස පිරුණු වායුවයි

එදා මෙන් හිරු කිරණ
නිල් වලාකුළු තුළින්
මගේ මිහිතලය මත
නො මැත, අද වැටෙන්නේ



ලාල් හේවාපතිරණ(151)
(0714357606)
(මිහිසත මාතා පද්‍යාවලියෙන් උපුටා ගැනිණ)

## නියං සාය

විනකෙරූ කැලෑ පාලුවෝ දැක වනය දෙසින්
නිරතුරූ අලින් ගම් වදිනව වියරූ ලෙසින්
ඇති කෙරූ දෙයද මේ මිනිසම තමන් විසින්
සමුදුරූ වගේ තිබු වැව් ඉරිතලා ගොසින්

දුන්නට දොල පිදුම් දෙවියන් හට බැතිව
රක්නට වෙලා අඹු දරුවන් ණය ගැතිව
ඉන්නට හැකිද, කෙනෙකුට සුවයක් ඇතිව
බොන්නට පිසිව දිය උගුරක්වත් නැතිව

අවියට මතට බලයට රට රුදුරු වෙලා
ගොවියට තිබුණ ගහකොල වැල් පිදුරු වෙලා
සවියට බෙදන බඩු මල්ලත් සිදුරු වෙලා
දිවිගැට ගැසුම හුගකට වන කඳුරුවෙලා

-පේමදාස අතාවුද- (3146)
0112 928944
077 3410528



# අධිපතිතුමන් දැන් නම්... !

වියලුන වැවට දිය පොද ඒ තරම්     නොවේ
කතරට ඉලුක් ගස ලොකු සෙවනකුත්     නොවේ
සා ගින්දරට වී ඇටයෙන් පලක්     නොවේ
ලතෙත් ගුණොන් විය සිදුරට ණායක්     ගෙවේ

ගෙවුන සමය ගැන සිතමින්     නිසංසලේ
පැද්දෙනු වැනිය සුළඟට නැගී     සරුංගලේ
දිස්නය නැතේ පෙර මෙන් කණ     අරුංගලේ
දියකළ සවිය ඔබටයි මග පෙහෙළි     කළේ

කෙහෙ සුදු වුනේ ඔරලෝසුව හැඩුව     නිසා
ගත වැහැරුනේ දෑතින් වෙර වැඩුව     නිසා
පඩිපත සුළු වුනේ කලියෙන් යැවුනු     නිසා
ගිමන් කළ දිගයි දෙව් බමු නොමැති     නිසා

දහවෙනිදාට දියවක සඳ මතු වෙන     වා
පසුදා පටන් ටික ටික හඳ දිය වෙන     වා
මාසේ වැඩි දිනක් අඳුරම ඉවසන     වා
කණාමැදිරි එළි බිඳටත් හිත දෙන     වා

දෙරණේ මහ පිරිස් අප වැනි දෙවු     උන්දා
අහකට නොදා අය වැය ළගටම     කැන්දා
අඩු ලුහුඩුකම් ගැන තේරුම් ඇති     සන්දා
හැන්දට අතක් ඔබ හැර වෙන කවුරුත්     දා

තරුපති නිසා සදවන සුදු එළිය     ගෙනේ
ගෘහපති වුයෙන් මුළුතැන් ගෙයි හිගය     පෙනේ
**භූපතිඳුන්ට වැඩිහිටි ජන හඬ     ඇසුනේ**
**අධිපති තුමන් දැන් නම් සහනයක්     ගෙනේ**




අමරපාල කරසිංහ ආරච්චි (1230)
(078 5863155)




# සිත්තමට තුරුළු වී !

නොදුටු කිසිදින - මවගේ රුව ගුණ
ඇඳුනි පොළොවේ - මුහුටි පුරතින්
තුරුලට ගොසින් - වක ගැසී සැනෙකින්
ගුලි වුනා උණුසුමට විගසින් !

සුවිසල් ගත රලු පොලොව මත්තේ
සැතපිලා සිටියදී ඇඳුනු රුව මත
දැනුනා සුවඳ හැවුම් මිහිතල
කිරි සුවඳ යැයි මා රැවටුනා නෙකවර !

දෑත දිගු කර පා සිනා
    මා රැගෙන ඇකයට
කියා රසකවි කතන්දර
    විසිතුරෙන් මත් කොට
සිඹ හිස් මුදුන අතගා
    මා තුරුළු කොට
දැවටී එන්න අම්මේ
    රෑ මැදි සිහිනෙකට !

පුතුගේ තනිකමට ඔබ හිත රිදෙනවද
දෙව්ලොව ඉදන් නැවතත් මෙහෙ බලනවද
ඔබේ සුදු පුතුට වැතිරුණ සිත්තමේ මැද
දුක නැති වෙන්න හීනෙන් කිරි පොවනවද !!!




ජගත් කාරියවසම් (1215)
038 - 2236643
077 - 9507184

# කර්මය ගැන වූ පිළිතුරට පිළිතුරක්

මා විසින් 2014 ජනවාරි / මාර්තු කලාපයේ මගේ නමින් පළ වූ කර්මය ගැන ලිපියට 2014 අගෝස්තු / සැප්තැම්බර් සැඳෑව කලාපයේ මා මිත්‍ර ගෝමිස් මහතා විසින් පළ කරවූ පිළිතුර සම්බන්ධවයි. ඔහුගේ පිළිතුර දැකීමෙන් එක් අයෙකු හෝ මගේ ලිපිය කියවා ඇතැයි සිතීමෙන් මම සතුටු වෙමි. කියවීමෙන් නොනැවතී ඊට පිළිතුරක් ද පළ කරවීම ගැන මම ඔහුට ස්තූති කරමි. එහෙත් එය අර්ථවත්, කරුණු ඒත්තු ගන්වන ගතියෙන් අඩු බව කණගාටුවෙන් මුත් කිව යුතුය.

කර්මය නැමති පෙරදිග සංකල්පය අසත්‍යයක් යයි කීමට මම මගේ ලිපියෙන් අදහස් නොකළෙමි. එය සැබැවින්ම ක්‍රියාත්මක වේ නම් එහි ගුප්ත සූක්ෂම බලය ක්‍රියාකාරීත්වය ගැන සිතීම පවා මට ඉමහත් සතුටකි. එම සතුටින්ම මම එය අගය කරමි. එහෙත් කරුණු දෙකක් හේතුවෙන් කර්මය සැබැවින්ම ක්‍රියාත්මක වන්නේ දැයි යන සැකය මට ඇතිව තිබේ.

1. සත්ත්වයා ස්වභාවයෙන්ම ආත්මාර්ථකාමී බැවින් ද එසේ වීමට සලස්වා ඇත්තේ සොබා දහම බැවින් ද එම ආත්මාර්ථයෙන් සිදු කරන සැහැසි ක්‍රියා වලට සොබා දහම කර්මය මගින් සත්වයාට දඬුවම් කරයි ද?

2. මිහිමත ඇති සත්ව සංඛ්‍යාව අති විශාලය. මිනිස් වර්ගයා ඉන් ඉතා අල්ප වූ සංඛ්‍යාවකි. මිනිසා හැර අනෙකුත් සතුන් ක්‍රියා කරන්නේ කිසිසේත් හොඳ නරක දැන ගෙන නොවේ. මිනිසාගේ වුව එම දැනුම සතුටුදායකම නොවේ. එහෙයින් සාධාරණ වූ කර්මය සත්වයින් හා මිනිසුන් හට දඬුවම් දෙන්නේ ඇයි ද යන සැකයයි.


ඉහත සැකයන් ඉවත් කර ගනිමින් කර්මය සැබැවින්ම පවතී යැයි සිතීමට ගෝමිස් මහතාගේ පිළිතුර කරුණු සපයා ඇතැයි කිව නොහැක. මා එසේ කීමට හේතු විස්තර කරනු කැමැත්තෙමි.

ක්‍රිස්තු ධර්මය සහ ඉස්ලාම් ධර්මය කර්ම සංකල්පය විශ්වාස කරන බවට ඔහු ඉදිරිපත් කරන සාක්ෂි දුර්වලය. කිසිසේත් ප්‍රමාණවත් ද නැත. ඒවා දේව ආගම් මිස කර්ම විශ්වාස කරන ආගම් නොවේ. එම ලබ්ධීන්ට අනුව මිනිසාගේ හොඳ නරක ක්‍රියාවලට විපාක ලබා දෙන්නේ කර්මය නොව දෙවි කෙනෙකු විසින්ය. ජේසුස් වහන්සේ ''නුඹ වපුරන්නේ යමක් ද එයම කපා ගනී''කී පමණින් එතුමා කර්මය ගැන කී බව අප නිගමනය කරන්නේ කෙසේද? එම කියමනේ වෙනත් තේරුම් ද තිබිය හැක. උදාහරණයක් වශයෙන් උත්සාහ කළ පමණට ඵල ලැබිය හැකිය යනුවෙන්ද එය අර්ථ නිරූපණය කළ හැකිය. මිනිසාට සත්වයාට හානි කර අකුණු සැටීම්, කුණාටු, ජල ගැලීම්, නාය යෑම් සහ සුනාමි වැනි දෙය සොබා දහමෙන් සිදු වන බව සැබෑය. මෙම සිදුවීම් හුවා දක්වමින් ගෝමිස් මහතා සොබා දහම සැහැල්ලු කොට දක්වයි. එවැනි විනාශ ඇතත් ජීවයේ හට ගැන්මට, එහි පැවැත්මට ව්‍යාප්තියට සහ නැවත උත්පාදනයට සොබා දහම කර ඇති, කරන කාර්යය ප්‍රමාණය ඊට යොදා ඇති විස්මිත ඥාන සම්භාරය කොතෙක් දැයි ජීව විද්‍යාව ගැන මඳ දැනුමක් ඇත්තෙකු වුව දනී. දැන් කර්මය සත්‍ය වශයෙන් පවතින්නක් නම් එය ජීවය ජනිත කළ සොබා දහමේම අපූර්ව ක්‍රියා මාර්ගයක් විය යුතුය. එය පිළිගැනීම ගෝමිස් මහතා උවමනාවෙන් ම මග හරී. එහෙත් කර්මය සොබා දහම තුළ ක්‍රියාත්මක වන බව නම් ඔහු පිළිගෙන ඇත.

සත්වයාගේ පුද්ගල කැමැත්ත වෙනුවෙන් සොබා දහම ආත්මාර්ථය ඔවුන් තුළ ඉස්මතු වීමට ඉඩ සලසා ඇත. විවෘත මනසකින් බලතොත් එය කාටත් පෙනේ. මිනිසාට ද සොභාවයෙන් ම ලැබෙන ආත්මාර්ථය දුරු කර ගැනීමට පරාර්ථ හුරු පුරුදු වීමට ඔහුගේ බුද්ධිය වැටහීම ඉවහල් වන බව සැබෑය. අනෙක් සතුන් ලබා උපදින ආත්මාර්ථය ආදම් ඒවා නිසා යයි කීම තනිකර මුසාවකි. විහිලුවකි. ෆෙඩ්රික්(Fedric) නිශ්චේ කියා ඇති පරිදි සත්වයා තුළ බලවත් ජීවිත ආශාවක් සැබැවින්ම පවතී. ඊට ඇඳුන අනෙක් සත්‍ය පෙළඹීම වන්නේ එම ආසාව හේතුවෙන් එක එකා පරයා ජීවත් වීමට යත්න දැරීමය. ඒ ආත්මාර්ථයෙනි.

ඔහුගේ ලිපියේ අවසාන ඡේදයෙන් ගෝමිස් මහතා කර්මය ගැන වූ මගේ දෙවැනි සැකයට පිළිතුරු දීමට යත්න දරා ඇත. එහෙත් චේතනාව කර්මය වේය කී පමණින් හොඳ නරක නොතේරෙන සත්වයින්ට කර්මය දඬුවම් දීම සාධාරණ දැයි අසන ප්‍රශ්නයට පිළිතුරු නොලැබේ. එය ප්‍රශ්නය ලිස්සා හැරීමක් පමණි. අනුන්ට හිංසා සහගත චේතනා වලින්ම පව් සිදු වන බව සතුන් නොදනිත්. චේතනා සහ ක්‍රියා වල හොඳ නරක මිනිසා වුව වටහා ගන්නේ ඔහුගේ දැනුම් තේරුම් පරිසරය සිරිත් විරිත් යනාදිය අනුවය. එහෙයින් ක්‍රියාව නැතත් චේතනාවෙන් පමණක් වුව පාප සිදුවී සතුන්ට කර්ම විපාක අත්වේ යැයි සිතිය නොහැක. මිනිසා වුව සිතන තරම් එයට භාජනය නොවනු ඇත. ඒ ඔහුගේ හොඳ නරක මිනුම් කරුණු කීපයක් මත රැඳෙන බැවිනි.

ගෝමිස් මහතා ඔහුගේ පිළිතුරේ කීප තැනක මා අදහස් පටලවා ගෙන ව්‍යාකූල වී ඇති බව කියයි. ඒ කියුම් වලට සරිලන සාරවත් බවක් ඔහුගේ පිළිතුරේ නම් නැත. ඒ තුළ ඔහුගේ තර්ක පිළිගත හැකි කරුණු මත ඉදිරිපත් කරනවා වෙනුවට අඩු වශ විභාගයෙන් ආගම් කතුවරුන්ගේ කියුම් උපුටා දක්වා ඇත. එය ප්‍රතිවාදීන් නිරුත්තර කරන අයුතු ප්‍රයෝජන ගැනීමකි. ඒ උත්තමයන්ට ගරු කරනු වස් ප්‍රතිවාදීහු නිහඬ වෙත්. කෙසේ වෙතත් ගෝමිස් මහතාට මම ස්තූති කරමි. ඔහු අන්‍ය ආගම් වලට දක්වන ගෞරවය සැලකිල්ල අගය කළ හැකිය.



ඩබ්.ඩී.ඒ. රේමණ්ඩ් - (554)

# අපේ පිටුව

අපේ පිටුව අපේ පිටුව අපේ පිටුව



"විශ්‍රාම" කියන වචනයට "විවේකය" කියන වචනය ළඟ ඥාති සම්බන්ධයක් ඇති පර්යාය වචනයක්. එක දිගට දශක දෙක තුනකට වැඩිය රැකියාවත් එක්ක උණුසුම් වෙලා කල්පිරුනම විශ්‍රාම ගන්නවා. එතන ඉඳල නිවී හැනහිල්ලේ විවේකයෙන් ඉන්න යොමු වෙනවා. ඒත් ක්‍රියාශීලී පුද්ගලයෙකුට එහෙම ඉන්න හිත දෙන්නේ නෑ. මොකටද අහෝසි වෙන්නේ - මොකටද අවලංගු වෙන්නේ කියලා හිතන්න හයියක් තියෙන පුද්ගලයා දන්නවා කාලය කියන්නේ ගනුදෙනුවකට ඇරිලා තියෙන දොරටුවක් කියලා. ඇත්තටම කාලය කියන්නේ ගනුදෙනුවකට විවෘත වෙච්ච කොරිඩෝවක් තමයි. අපේ විශ්‍රාමික සංගමයේ බොහෝ දෙනෙක් "විශ්‍රාමය නොහොත් විවේකයෙන් ලාභයක් ලැබිය හැකි වන්නේ කාලය නිකරුණේ අපතේ නොහැරීමෙන් බව දන්නවා. ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් කියන කෘතහස්ත දේශපාලනඥයා දැක්වූ ඒ අදහස් තුළ තියෙන්නේ සර්වකාලීන ලක්ෂණයක්. ඒ පදනම මත ඉඳගෙන බැලුවම අපේ මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය තුළ කාලය අපතේ නොයවන විශ්‍රාමිකයෝ ඕන තරම් ඉන්නවා. මේ ඒ වගේ කෙනෙක්.

ඔහු උපන්නේ 1951 දෙසැම්බර් 09 දා යි. රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ඡන්ද කොට්ඨාශයේ, අති සුන්දර වැලිගෙපොළ කියන ග්‍රාමීය පරිසරයේයි. පමාවෙමින් නාගරීකරණයට හා වාණිජකරණයට ලක් වන මූලික පහසුකම් අඩු ගැමි පරිසරය සොමයි, පිරිසිදුයි, පිවිතුරුයි. ඒ පිවිතුරු පරිසරය මැදින් ඔහු අකුරු කරන්න ගියේ කෝන්ගස්තැන්න මහා විද්‍යාලයට. විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයෙක් වුණා. එතැනින් විශ්ව විද්‍යාලයට තේරුණා. ඒත්.......? ඒත් ඔහුට එතැනදී මාර්ග දෙකක් දෘෂ්‍යමාන වෙනවා. ඒ කියන්නේ විශ්ව විද්‍යාලයට යනවද? ශ්‍රී ලංකා මහ බැංකුවට යනවද? කියන උභතෝකෝටිකය ඇතිවුණේ දෙකටම එකම වකවානුවේ කැඳවීම් ලැබුණ නිසා. ඔහු මහ බැංකුව තෝරා ගත්තා. 1975/06/16 වැනිදා ඔහු මහ බැංකු සේවාවට එකතු වුණා.

එතැන් පටන් රාජ්‍ය ණය, බැංකු කටයුතු, සේවක අර්ථසාධක අරමුදල් හා ප්‍රවෘත්ති (වර්තමාන සන්නිවේදන) කියන දෙපාර්තමේන්තු වලට අනුයුක්තව කටයුතු කළා. එහිදී විශ්ව විද්‍යාලයෙන් වගේම දැනුම් සම්භාරයක් ලබා ගැනීමට උත්සුක වුණා. ඒ අතරතුර බාහිර උපාධියකටත් සුදානම් වුණා.

ඔය වකවානුව තුළ බැංකුවේ පැවැති විවිධ ස්වේච්ඡා සංවිධානවල නේකවිද තනතුරු ඔහු සොයා පැමිණියා. විශේෂයෙන්ම මහ බැංකුවේ බෞද්ධ සංගමය, සිංහල සංස්කෘතික සංගමය වැනි සංගම්වල නිළතල දැරූ ඔහු කලබල නැති, විචක්ෂණශීලී, තැන්පත්, ශික්ෂණයකින් යුතු පුද්ගලයෙක් බව පොදු කටයුතු වලදී ප්‍රකට කළා. ඇත්තටම ඔහු නිහඬ, ඒත් ක්‍රියාශීලී තැන්පත් පුද්ගලයෙක්. ශාස්ත්‍රීය කටයුතු වලට ද යොමු වෙමින් උපාධි පරීක්ෂණයේ ප්‍රථම අදියර ද සමත් වී, ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ හැදෑරීම් කරමින් ම සිටියදී තමයි ඔහුගේ ගමන් මගේ හැරවුම් ලක්ෂය සටහන් වෙන්නේ.

එනම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශාල ම ශක්තිමත් ම වෘත්තීය සමිතිය වන මහ බැංකු සේවක සංගමයේ උප සභාපති තනතුරකට පත් වෙනවා. එතැනින් පටන් ගත් පොදු සේවාවන් හා සමාජ ක්‍රියාකාරී කටයුතු සඳහා වැඩි වැඩියෙන් ඇපවීම, කැපවීම නිසාම දේශපාලනිකව ඔප වැටෙනවා. දේශපාලනිකව දිගු ගමණක් යෑමට කළ එළි බැස ඇති ඔහු ප්‍රදේශය පුරාත්, දිස්ත්‍රික්කය පුරාත්, රටේත් විවිධ සංවිධාන වලට සක්‍රියව සම්බන්ධ වී ඇති අන්දම පහත සඳහන් තානාන්තර වලින් හඳුනාගත හැකිය.

ගෝනවල, කුරුඳුවත්ත සුභ සාධක සමිතියේ ප්‍රධාන ලේකම් ලෙස ද, එහි ශාන්ති වැඩිහිටි සංවිධානයේ සභාපති ලෙස ද, තල්වත්ත, බොල්ලෑගල එක්සත් සුභ සාධක සමිතියේ අනුශාසක ලෙස ද, එහි ශ්‍රී විජයාරාම දායක සභාවේ ප්‍රධාන ලේකම් ලෙස ද, කැළණි මිටියාවත සිංහ සමාජයේ ලේකම් ලෙස ද, ගම්පහ දිස්ත්‍රික් මහ බැංකු විශ්‍රාමික සුහද එකමුතුවේ සභාපති ලෙස ද, ගෝනවල සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපති ලෙස ද, ලෝක බෞද්ධ සම්මේලනයේ යාව ජීව සමාජිකයෙකු ලෙස ද, සී/ස. බියගම වෙළඳ සමිතියේ ලේකම් ලෙස ද, බියගම විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකත්වය ද සරසන ඔහු, විශ්‍රාම ගැනීමෙන් පසුව බියගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී වරයෙකු ද වේ. ඒ නිසාම කාර්ය බහුලය.




දේශපාලනය හා දේශපාලනඥයන් උපහාසයට, පරිහාසයට හා අපහාසයට ලක් වෙමින් පවතින ප්‍රවර්තනයේ, මඩ ගොහොරුවෙන් පැන නැගි නෙළුමක් මෙන්, කිළිටි නොවී, ප්‍රගති ගමණක් යාමට පිය මසවන ඔහු වනාහී අන් කවරෙකුවත් නොව දේශ බන්ධු, සාම විනිසුරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුලියද්ද ලේකම්ලාගේ කරුණාරත්න හෙවත් **A. L. කරුණාරත්න** තුමා වන්නේය.

-සංස්කාරක-

# PURPLE AND YELLOW BUDS

Purple and yellow buds are blooming against our garden wall. Nostalgic memories of more than half a century come into my mind .................. **It was a starry night in cold December. It was the Christmas eve.** My two brothers, sister and I were playing with new toys till late in the evening. Mother put us to sleep bit early to enable us to go to church for the morning Christmas mass.

In the middle of the night we were disturbed, taken to another section to sleep, in order to provide our sleeping area to the visitors. As I was passing the dining room I spotted a large decorated white cake with tiny yellow and purple flowers. The fond memory of which was to stay vivid throughout my life. (Cakes were very rare then)

Then I was about eight years old. We lived in a big house with a large garden. There were rabbits in cages and pigs in a corner, some coconut trees were reserved for the "Toddy Tapper". Daily he provided us with a fresh pot of toddy. Sometimes **my mother made nice hoppers** with it. **To men folk it was a delicious drink.**


Uncle Billy was a regular visitor in our house. He used to play and feed the rabbits with us, related stories. Therefore his visits were most welcome. He was a tall, dark, curly haired handsome person. A medical practitioner by profession like my father. This time uncle Billy has not come alone, but with a lovely young lady. She wore new frocks, but never went out. They were with us for some weeks. I was curious.


Suddenly my mother went shopping, brought silk material, gold sandals and cosmetics for this lady. I also noticed that when the police officers (my father's friends) visited us, father, uncle Billy and they were careful to speak in whispers.


Another night dawned. There was half moon, it was still an enchanting night. I saw that lovely lady dressed in a light pink silk sari in Kandyan style. Her long glistening black hair was plaited and was cascading up to her knees. Against the light of the "Patromax lamp" **her slim figure made a beautiful picture.** Then came uncle Billy, smartly dressed. They bowed down and worshipped my mother and father. Kissed me too............. I heard my father telling mother that they have to produce themselves before the **magistrate court in Kurunegala** in the morning.

In the same manner they entered our house, they left us in the dark. May be to build a new nest I was sad, sighed and whispered to myself, perhaps "**Purple and Yellow buds may bloom in their garden hedge too ..................'**

**Berney Fernando (331)**
**0112657685 / 0718106042.**







# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින් සඳහා ණය මුදලක්

2014 අයවැය යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට අනුව රජයේ විශ්‍රාමිකයින් වෙත රාජ්‍ය බැංකු මගින් රු.500,000 ක උපරිමයකට යටත්ව ණය මුදලක් ප්‍රදානය කරන ලදි. මෙම ණය මුදල ඇප රහිතව ලබා දෙන අතර රක්ෂණයට යටත්ය. මෙම ණය මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයන් වන අපගේ සාමාජිකයින්ට ද ලබා දෙන ලෙස ඉල්ලා සාමාජිකයින් විශාල පිරිසකගේ ඉල්ලීම් ඉදිරිපත් විය.

දීර්ඝ කාලයක් තිස්සේ විශ්‍රාම වැටුප් ගැටළුවකට මැදිවී සිටින අප සාමාජිකයන්ගේ ක්‍රය ශක්තිය දැන් හොඳටම පිරිහී ඇත. 2015 වසරේ යහපත් විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලැබේය යන විශ්වාසය වර්තමාන අධිපතිතුමා කෙරෙහි ඔවුන් තබා ඇති බැවින්, එම වැඩිවීම ලැබෙන තෙක් යම්තාක් දුරට හෝ තම මූල්‍ය ප්‍රශ්න, ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය බැංකු මගින් දෙන ණය මුදල ලබා ගත හැකි වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙස සාමාජිකයන් සංගමයෙන් ඉල්ලා සිටින ලදි.

සංගමය මේ සම්බන්ධයෙන් සොයා බැලීමේදී පෙනී ගියේ රාජ්‍ය බැංකු විශ්‍රාමිකයින් වෙත ලබා දෙන ණය මුදල රජයේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ වැටුප් ලේඛණයෙන් විශ්‍රාම වැටුප් ලබන්නන් සඳහා පමණක් ක්‍රියාත්මක වන බවයි. මේ නිසා අපට විකල්පයක් සොයා යෑමට සිදු විය. ඒ අනුව සංගමය විසින් පෑන් ඒෂියා බැංකුව සමග සාකච්ඡා කොට මහ බැංකු විශ්‍රාමිකයන් සඳහා වෙනම ණය ක්‍රමයක් හඳුන්වා දීමට හැකියාව ලැබුණි. මෙම ණය මුදලේ විශේෂ ලක්ෂණ පහත පරිදි වේ.

1. ණය මුදලේ උපරිමය ලක්ෂ 10
2. උපරිම වයස් සීමාව අවුරුදු 70
3. පොලී අනුපාතය 14% වාර්ෂිකව - හීන වන ශේෂ ක්‍රමයට පොලිය අය කෙරේ.
4. ආපසු ගෙවීම් කාලය ණය ලබාගන්නා පුද්ගලයාගේ වයස අනුව තීරණය වේ. එනම් වයස අවුරුදු 70 දී ණය මුදල ගෙවා අවසන් විය යුතුය. (උදා :- වයස අවුරුදු 63 වන පුද්ගලයෙකුගේ ආපසු ගෙවුම් කාලය අවුරුදු 7කි.)
5. ණය ලබා ගැනීමට විශ්‍රාම වැටුප පෑන් ඒෂියා බැංකුවේ ණය ලබා ගන්නා ශාඛාවට මාරු කළ යුතුය.
6. ණය කාලය තුළ එය වෙනස් නොකරන බවට මහ බැංකුව වෙත පොරොන්දු ලිපියක් මගින් සහතික විය යුතුය.
7. එවිට මහ බැංකුව විසින් අදාළ කාලය තුළ විශ්‍රාම වැටුප් නම් කරනු ලබන පෑන් ඒෂියා බැංකුවේ අදාළ ශාඛාව වෙත එවන බවට සහතිකයක් නිකුත් කෙරේ.
8. ණය මුදල රක්ෂණය කළ යුතුය. එය ණය දෙන බැංකුව මගින් කරනු ඇත. රක්ෂණ ගාස්තුව එක් වරක් පමණක් ගෙවිය යුතුය. රු. 100,000/- ණය මුදලක් සඳහා ගාස්තුව රු. 852/- කි.
9. මෙම රක්ෂණ ක්‍රමයේ විශාල වාසියක් ඇත. එනම් ණය මුදල ගෙවමින් පවතින අවස්ථාවකදී ණයකරුගේ ජීවිතයට යම් හානියක් සිදු වුවහොත් ණයකරු ගෙවූ සියලුම මුදල් නම් කරන පුද්ගලයෙකුට ගෙවනු ඇත. උදාහරණ වශයෙන් රු. ලක්ෂ 10 ක මුදලක් ලබා ගෙන රු ලක්ෂ 9 ක් ගෙවා අවසන් වූ අවස්ථාවක ඔහුගේ ජීවිතයට හානියක් සිදු වුවහොත් ලක්ෂ 9 ම නම් කළ පුද්ගලයාට රක්ෂණ සමාගමෙන් ලැබේ.
10. ප්‍රතිලාභ ලැබීම සඳහා ඥාතියෙකු නම් කළ යුතුය.
11. ග්‍රාම සේවක සහතිකයක් මගින් පදිංචිය තහවුරු කළ යුතුය. (මේ සඳහා අවශ්‍ය ෆෝරම බැංකුව මගින් ලබා දෙනු ඇත.)
12. ණය ආපසු ගෙවීමේ වාරිකය රුපියල් ලක්ෂයක් සඳහා පහත දැක්වෙන පරිදි වේ.

| ආපසු ගෙවීමේ කාලය මාස | මාසික වාරිකය |
|---|---|
| 84 | 1874.00 |
| 72 | 2060.57 |
| 60 | 2326.83 |
| 48 | 2732.65 |
| 36 | 3417.76 |
| 24 | 4801.29 |
| 12 | 1978.71 |

එදිනෙදා ආර්ථික දුෂ්කරතාවයෙන් ගොඩ ඒම සඳහා

ණය ලබා ගැනීම විසඳුමක් නොවන බව සඳහන් කරනු කැමැත්තෙමු. ඒ සඳහා අරපිරිමැස්මෙන් කටයුතු කිරීම ප්‍රගුණ කර ගන්නා ලෙස නිර්දේශ කරන අතර, ණය ලබා ගැනීම අධෛර්යය කරමු. කෙසේ වෙතත් කරුණු සොයා බැලීමේදී සමහර සාමාජිකයන් පත්ව ඇති අසීරු අවස්ථාවලින් ගොඩ ඒමට මෙම ණය මුදල මහත් පිටුවහළක් වන බව පෙනී යන බැවින් මෙවැනි ණය ක්‍රමයක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට සිදුවූ බව කරුණාවෙන් සලකනු මැනවි. මෙම ණය මුදල ලබා ගැනීමට අවශ්‍ය සාමාජිකයින් ඇතොත් ළඟම ඇති **පෑන් ඒෂියා බැංකු ශාඛාවකට** ගොස් අදාළ ඉල්ලුම් පත්‍ර ලබා ගන්නා ලෙසත් වැඩි විස්තර අවශ්‍ය නම් 071 2207102 අංකයට අමතා ලබා ගන්නා ලෙසත් දන්වා සිටිමු.




**ලක්ෂ්මන් ද සිල්වා**
සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුව
විශ්‍රාමිකයන්ගේ සංගමය





## Marriage is like a Bank Account Deposits and Withdrawals

The Local Bank Manager was a friendly adviser to all his customers. He adviced them to increase their deposits and minimise withdrawals.

When a young customer wanted to withdraw a Large amount for his marriage expenses he repeated his warning against withdrawals.

The customer then inquired.

" What is the harm in withdrawing?"

The Manager said, " Each time you withdraw you lose interest".

When the customer called at the Bank after his marriage the Manager congratulated him and inquired .

" How is Marriage life? "

The customer replied " Oh ! it is like a Bank Account."

The Manager " What do you mean? "

The customer " Each time I withdraw I lose interest "

The Manager noticed that a customer who had big family had not been making deposits for some time. He repeated his usual advice regarding deposits. The customer inquired.

" What is the benefit in depositing "

Manager " Each time you deposit you increase your stock"

Customer " Then it is like marriage "

Manager " What do you mean? "

Customer " Each time I deposit I increase my stock"



**- P. Wattegama -**




## දෙවියනි ඔබ මැව් ලොව පුදුමයි.......!

දැඩි කුණාටුවකට හසුව මහ සයුරේ අතරමංව අනතුරකට ගොදුරු වෙමින් තිබුණු නැවක කපිතාන්වරයා, බරපතල අර්බුදයකට මුහුණ දෙමින් අවසාන වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ගයක් ගැන දස අතේ කල්පනා කරමින් සිටි අවස්ථාවේදී නැවේ පිරිස අමතා මෙසේ විමසා සිටියේය.

මේ නැවේ ඉන්න සිය ගණනක් සෙනග අතරින් - කාට හරි පුලුවන්ද- සැබෑ භක්තියෙන් සහ කැප වීමෙන් යුක්තව සෙසු පිරිස වෙනුවෙන්, ඔවුන්ගේ ජීවිත බේරා දෙන මෙන් - දෙවියන් වහන්සේට යාඥා කරන්න......"

ඒ ඇසූ එක්තරා පුද්ගලයෙක් සෙනග පීරා ගෙන සාඩම්බරයෙන් ඉදිරියට ඒමින් වහා පිළිතුරු දෙන්නට විය.

මට පුලුවනි, ඒ හැමෝම වෙනුවෙන් යාඥා කරන්න......."

තෑන්ක් - ගෝඩ් ......"මහත් සතුටට පත් කපිතාන් වරයා ඔහු පිළිගනිමින් ජයග්‍රහණයේ සංකේතය හස්ත මුද්‍රාවෙන් සිය ළය මත සළකුණු කරමින්, තම ඉල්ලීම අවසන් කළේය.

බොහොම හොඳයි...... එහෙනං, අනෙක් හැමෝම ජීවිතාරක්ෂක කබා පැළඳ ගන්නා තුරු - ඔබ යාඥා කරන්න......අපිට එක කබායක් අඩුවෙනුයි, තියෙන්නේ......"

**- ගාමිණී චන්ද්‍රසේන-**

# WHEN INSULTS HAD CLASS

These glorious insults are from an era before the English language became boiled down to 4 letter words.

A member of parliament to Disraeli. British Premier "Sir ,you will either die on the gallows or of some unspeakable disease.

That depends Sir said Disraeli "Whether I embrace your policies or your mistress."

"He had delusions of adequacy" Walter Kerr

"He has all the virtues I dislike and none of the vices I admire" British Premier Winston Churchill

"I have never killed a man , but I have read many obituaries with great pleasure" Clarence Darrow.

"He has never been known to use a word that might send a reader to the dictionary"

William Faulkner (about Ernest Hemingway)

"Thank you for sending me a copy of your book: I ll waste no time reading it,"
Moses Hadas.

"I didn't attend the funeral , but I sent a nice letter saying I approved of it" Mark Twain.

"He has no enemies but is intensely disliked by his friends."Oscar Wilde

"I am enclosing two tickets to the first night of my new play bring a friend if you have one."

George Bernard Shaw to Winston Churchill.

Cannot possibly attend first night, will attend second ... if there is one "Winston Churchill in response"

"I feel so miserable without you : it's almost like having you here" Stephen Bishop.

"He is a self made man and worships his creator" John Bright .

"I've just learned about his illness. Let's hope it's nothing trivial" Irwin S. Cobb.

"He is not only dull himself : he is the cause of dullness in others" Samuel Johnson.

"He is simply a shiver looking for a spine to run up" Paul Keating

"In order to avoid being called a flirt, she always yielded easily"- Charles Count Talleyrand.

"He loves nature in spite of what it did to him" Forrest Tucker.

"Why do you sit there looking like an envelop without any address on it?" Mark Twain

"His mother should have thrown him away and kept the stork" Mae West.

"Some cause happiness wherever they go: others whenever they go" Oscar wilde.

"He uses statistics as a drunken man uses lamp posts .. for sup port rather illumination"



Andrew Lang (1844-1912)

"He has Van Gogh's ear for music" Billy Wilder .

"I 'v had a perfectly wonderful evening. But this wasn't it" Groucho

**Parakrama Jayasuriya**

# 2014 / 09 / 27 සතුට ගෙනා - දිනක් වුනා.

සහසුද්දෙන්ම කියනවා නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයන්ගේ සංගමයේ වත්මන් විධායක කමිටුව, සිය ගිය වසර තුළ දියත් කරන සියලුම වැඩසටහන් හා කාර්යාමයන් අතිශය මානුෂිකයි. ඒ වැඩ සටහන් තුළ පොදු යහපත කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරීත්වයන් මිස පුද්ගල කේන්ද්‍රීය කටයුතු නැහැ. කල්ලිවාදී කටයුතුත් නෑ. නිර්ලේපිත ලෙස කවුරුවත් වෙනුවෙන් කඩේ යන්නෙත් නැහැ. ඒ නිසාම තමයි කරන කියන ලියන හැම කටයුත්තක්ම "මානුෂිකයි" කියලා කියන්නේ.

නොබෝදා දියත් වූ සංගමයේ වාර්ෂික එක් දින චාරිකාව සහසුද්දෙන්ම මානුෂිකයි. අතිශය මානුෂිකයි. ඕනෑම දෙයක් අතිශය මානුෂික වෙන්නේ දෙයක් තුළ අන්තර්ගත විෂය මානුෂික වුනාම විතරයි. දීර්ඝ කාලයක් එකට එක පොකුරේ, එක වදුලක* තුරු ලතා පෝෂණය කරමින් අර්ථවත් කැපකිරීම් වලට අර්ථ සපයු යහළු යෙහෙළියන් යළිත් ගෙවියන ඇසිල්ලකදී මුහුණට මුහුණ මුණ ගැසීම "මානුෂික සංසිද්ධියක්" නොවෙයි නම් වෙන කුමක්ද?

2014/09/27 වැනිදා යළිත් මුණ ගැසුණ හැමෝම තුළ ඉස්මතු වෙලා ලෝරි ගලා ගෙන ගියේ සතුට. ඒ සතුට ලබා දීම "මානුෂික" වුවත් බව විවාදයක් නොවෙයි. මේ ලෝකයේ සෑම සොඳුරු බවක් හා ශ්‍රේෂ්ඨත්වයට පත් සියල්ලක්ම උපදින්නේ මනුෂයෙකුගේ සිත තුළ පහළ වන එක් සිතුවිල්ලකින් නැත්නම් හැඟීමකින් බව "ඛලිල් ජිබ්රාන්" වරෙක පැහැදිලිව සටහන් කරලා තියෙනවා. එදා ඒ හැඟීම් යළිත් පිබිදුනා. ඒ සමගම මුව පුරා සිනා රැළි තරංග දී දී මතු වුනා. හැමෝගෙම දෑස් දීප්තියෙන් දිදුලන්න වුනා. ඔරලෝසුවේ තත්පර කටුව, විනාඩි කටුව හා පැය කටුව අමතක වෙලා ගියා. ඒ තරමටම දොඩමලු වුනා.



"සැඳෑව" ඔරලෝසුවට තට්ටු කරන තුරු කාලා, බීලා, සිංදු කියලා, මැජික් බලලා, අවට පරිසරය නරඹලා ආපසු හැරුණා. "සැඳෑව" පටන් ගත්තා විතරයි. ගෙවී යන්න තව දුරයි. ඉතිරි ටික අනාගතයයි. අනාගතය ඉතිරිව ඇත්තේ කළකිරීමෙන්, ද්වේෂයෙන්, අප්‍රසන්නතාවයෙන්, තරහෙන් ගෙවා දැමීමට නොවෙයි. සතුටින් ගෙවා දැමීමටයි.

කළකිරීම, පසුතැවීම, ද්වේශය, අප්‍රසන්න බව, තරහව යන මානසික තත්වයන් ජීවිතයට ලබා දෙන ප්‍රතිලාභයක් නැහැ. ඒ හැඟීම් දිගින් දිගටම දරා සිටීමෙන් ලබා දෙන්නේ කල් පවත්නා ස්නායු ගත රෝග විතරයි. ඒ හැඟීම් වලින් අත් වුනාම ජීවිතයට ප්‍රබෝධය ලැබෙනවාමයි. ඒ නිසා එක් දින චාරිකාව "මානුෂික වුවත්". රෝග සුව කරන සායනයක්.

මෙවර එක් දින චාරිකාවට සහභාගී වූ පිරිස වෙනදාට වඩා වැඩියි. ගොඩක් වැඩියි. ඒකත් සතුටට කරුණක්. විශේෂයෙන් ම කැනඩාව වගේ දුර රටක ඉඳලා කෙටි නිවාඩුවකට ලංකාවට ආපු ජ්‍යෙෂ්ඨ සාමාජිකයොත් මීට සහභාගී වෙලා වැඩ පිළිවෙල අගය කළා. ඒ රටේ විරල, මේ රටේ බහුල සෞන්දර්යාත්මක වින්දනය සිත්සේ ග්‍රහණය කර ගත්තා.



ආත්ම විශ්වාසය, ආත්ම ශක්තිය, ආත්ම අභිමානය හා හෘද සාක්ෂිය අතර පවතින්නෙ අකලංක සහසම්බන්ධතාවයක්. ඒ මගින් උක්ත වින්දනීය පරමානන්දයට සාක්ෂි සපයනු ඇති. එම පරමානන්දය ජීවිතය තේරුම් ගත් මිනිසුන් අතර පමණක් හුවමාරු වන අගයක් බව සඳහන් කළ හැක්කේ ඒ නිසාමය.

සාම්ප්‍රදායික ගෘහ උපකරණ දෙකක් වන කුල්ල හා පෙනේරය ජීවිතයට බොහෝ දේවල් කියා දී ඇත. ජීවිත පරමානන්දය තේරුම් ගැනීමට ද එය ඉවහල් කර ගත හැක. කුල්ල මගින් ඉතිරි කරන්නේ ජන ජීවිතයට අවශ්‍ය දේය. කුල්ලෙන් පොලා පොලා අපවිත්‍ර දේ ඉවත් කර ඉතිරි කරගන්නේ ප්‍රයෝජනවත් දේ පමණකි. එහෙත් පෙනේරයෙන් හලා ඉතිරි කර ගන්නේ අනවශ්‍ය දේය. ප්‍රයෝජනවත් දේ පෙනේරයේ දැලෙන් හලා දමයි. මේ අනුව කළකිරීම, පසු තැවීම, තරහව, ද්වේශය පොලා පොලා ඉවත් කරන කුල්ලක් මෙන් පරමානන්දය ශේෂ කර ගමු.



-- 24 වෙනි පිටුවත් බලන්න --

## 2014 / 09 / 27 සතුට ගෙනා - දිනක් වුනා.





මොරටුව කිට්ටුව ඇක්වාපර්ල් හි දී.....






# සැඳෑව

சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2014 ඔක්තෝම්බර්/ දෙසැම්බර් කලාපය.



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක : QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.



ගරු ලේකම්,
මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,
116/2/1B, බෝ සමිඳු මාවත, දොලේකගත්ත,
මහරගම පාර, පිලියන්දල.



රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

සැඳෑව - සංස්කරණය
අමරපාල කරසිංහ ආරච්චි විසිනි.

Typesetting - **Graphicworld** - Panadura.
graphicworld.pan@yahoo.com